

සුබ අලුත් අවුරුද්දක් වේවා...!

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 අප්‍රේල් 13 වන බදාදා
දෙවන කාණ්ඩය දහ නවවන කලාපය
මිල රු. 50 යි



## මාලිගාවේ ඉන්දි රාජාට තවමත් හින්දි මතකයිලු

ජා ඇල පොලිසියෙන් යකින්නක් අල්ලලා නඩුවක් දාලා

යුද බිමේදී 58 වන සේනාංකයට යටත් වූ කොටි කතක්
ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා ගැන කියන කතාව

ධරණී ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

කැවිලි ගෙදර අම්මයි දුවලා දෙන්නයි

■ ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

# සාම්ප්‍රදායික බව රැකගෙන බටහිර පන්නයට හැඩවූ මුස්ලිම් මනාලියක්









මෙවර 'ධරණී' මනාලිය ඉදිරිපත් කරන්නේ කළුතර අවලා බියුටි සැලෝන් ඇන්ඩ් ඇකඩමිහි අවලා පතිරණ විසිනි.

සාම්ප්‍රදයිකත්වයට හානි නොවන ලෙස බටහිර ක්‍රමයට හැඩගැන්වූ සුන්දර මුස්ලිම් මනාලියක ලෙසයි මේ මනාලිය ඔබට ඉදිරිපත් කරන්නේ.

මුස්ලිම් මනාලියගේ ඇඳුමෙන් මුළු ශරීරයම වැසී තිබුණත් ඇගේ සුන්දරත්වය කැපී පෙනීම විශේෂත්වයකි. සාමාන්‍යයෙන් මුස්ලිම් මනාලියකගේ Eye Makeup එකට මූලික තැනක් ලබාදෙයි. Lip Makeup එකද ආකර්ශනීය විය යුතුය.

අතීතයේ සාරියෙන් හැඩවුණු ඔවුන් දැන් ක්‍රම ක්‍රමයෙන් බටහිර පන්නටද නැඹුරුව විලාසිතා අනුගමනය කිරීමට පටන්ගෙන ඇත. ශරීරය වැසෙන සේ ඇඳුම් ඇන්දත් ඒ ඇඳුම් මනා හැඩයකින් යුක්තව නිර්මාණය කරයි. Eye Makeup එක Lip Makeup එකට අමතරව ඇගේ මල් කළඹටද විශේෂ තැනක් හිමිවේ. ඊට හේතුව ඇය අවම ආභරණ ප්‍රමාණයක් පැලඳීමයි.

මනාලියගේ ස්වරූපය ගැන කියනවානම් ඇය සිහින් යුවතියකි. එමෙන්ම සාමාන්‍ය උසකින් යුත් පැහැපත් සමක හිමිකාරියකි. මනාලියගේ ඇඳුම් නිර්මාණය සඳහා යොදගෙන ඇත්තේ වැලන්ටිනා සහ එයට ගැලපෙන ලේස් රෙදි වර්ගයකි. එය නිර්මාණය කරන ලද්දේ මෙසේය. පළමුව ඇගේ හැඩතල මනාව ඉස්මතුව පෙනෙන සේ ෆිෂ්ටේල් ආකාරයට අත් රහිත ගවුමක් නිර්මාණය කර ඉන්පසු අත්දිගට බෙල්ල වැසෙන සේ ජැකට් එකක් නිර්මාණය කරන ලදි. ඉන්පසු ඇගේ හැඩය පිටිපස්සෙන් නොපෙනීම සඳහා ඉදිරිපස ඕපන් 3/4 ෆ්ලෙයාර්ඩ් සායක් ඇඳුමේ ඉනට එකතු කර ඉන්පසු බ්ලවුසයේ අවසාන කොටස සහ සායේ ඉන කොටස විවරය නොපෙනීම සඳහා පොඩි බෙල්ට් එකක් ආකාරයට පටියක් පළඳන ලදි. ඉන්පසු හිසට ලේස් යොදගෙන සාම්ප්‍රදයික ක්‍රමයට ෂෝල් එක දමා ඇත. මෙය නිර්මාණය කර දුන්නේ කළුතර N.L.Bridle හි ඉෂානි කාංචනා විසිනි.


මෙම සුන්දර මනාලියට ගැලපෙන පරිදි මල් කළඹ සැකසුවේ ජාඇල The Flower Art හි අධිපතිනිය වන නිසංසලා මදුෂානි විසිනි.

ආභරණ නැතත්, හිස වේලයෙන් වැසී සම්පූර්ණ ඇඟම වැසී තිබුණත් ඇගේ මුහුණේ ඇති සුන්දර Makeup එක සහ සුන්දර සිනහවෙන් ඇය සඳක් මෙන් බැබලෙයි.


**හිසට ලේස් යොදාගෙන ඔවුන්ගේ සාම්ප්‍රදායික ක්‍රමයට ෂෝල් එක දමා ඇත**

**ඇගේ ඇඳුම් නිර්මාණය ගැන කියනවා නම් එම නිර්මාණය සඳහා යොදාගනු ලබුවේ වැලන්ටිනා සහ එයට ගැලපෙන ලේස් රෙදි වර්ගයකි**

**ඈත අතීතයේ සාරියකින් හැඩවුණු ඔවුන් දැන් එයින් ඔබ්බට ගොස් බටහිර පන්නටද නැඹුරුව විලාසිතා කරනු ලබයි**



මනාලිය හැඩගැන්වීම - රූපලාවන්‍ය ශිල්පිනී
අවලා පතිරණ
(අවලා බියුටි සැලෝන්)



ඡායාරූප -
රවී ස්ටූඩියෝ
කළුතර

සම්බන්ධීකරණය -
ක්‍රිෂාන්ත පුෂ්පකුමාර
0763113839

ධරණී

# හයක් හතරක් නොතේරෙන දරුවන්ට අවුරුද්දෙ නැතිබැරිකම් දැනෙන්න දෙන්න එපා

***අද බොහෝ කාන්තාවන් කාර්යබහුලය. ඒ නිසාම දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒ අයගේ ජීවිතවලින් සතුට සහ ආදරය අන් හැමදේටම පෙර පලා යයි. නමුත් පුංචි පුංචි දේවල්වලින් සතුටු වෙන්නට පුරුදු විය හැකිනම් ඒ ඕනෑම කෙනෙකුගේ ජීවිතය හිතනවාට වඩා සුන්දර එකක් වනු ඇත. විදෙස් රටක ජීවත් වන හෂිනි මේ කියන්නේ ඕනෑම අම්මා කෙනෙකුට, ඕනෑම බිරිඳකට එසේ සතුටින් දිවි ගෙවිය හැකි ආකාරයයි.***

ඉස්සර වගේ නෙවෙයි මං වෙනස් වෙලා කියලා මටම දැනෙන තැන්වලදී පොඩි සතුටකින් හිත පිරෙනවා. හිත කළකිරවන සිද්ධියක වුණත් හොඳක් හොයාගෙන හිත සන්සුන් කරගන්න තරමට පරිණත වෙලා කියලා දැනෙනකොට සතුට වැඩියි. ගෑනු අපි ගොඩක්ම පරිණත වෙන්නේ පොතපත ආශ්‍රයෙන් නෙවෙයි, ජීවිතේ ලැබෙන අත්දැකීම්වලින්. සමහර අත්දැකීම් මතක් කරන එක පවා වේදනාකාරී වුණත්, ඒවාගෙන් ඉගෙනගත්ත පාඩම්වල වටිනාකම, අපිව කොයිතරම් දුරට පරිණත කරනවද, ඉදිරිය ගැන හිතන්න පොඹවනවද කියලා අපිටම දැනෙනවා. ඒ නිසා පුංචි දේවල් ලොකු කරගන්නේ නැතුව ඒ දේවල් දිහා සාධරණ විදියට බලලා, සතුට හොයාගත්ත අවස්ථා දැන් මගේ ජීවිතේ වැඩියි. මේ ලියන්නෙත් එහෙම එකක් ගැන.

මේ සැරේ අප්‍රේල් අවුරුද්ද ගිය පාර අවුරුද්දට වඩා හොඳට සමරන්න මං ආසාවෙන් හිටියේ අවුරුද්දෙ මුල ඉඳන්. බතික් ඇඳුම් අපි පස්දෙනාටම ගෙන්න ගන්න මං හිතින් සැලසුම් කළා. ගිය අවුරුද්දේ හැදුවාට වඩා අලුත් කැවිලි ජාති ටිකක් හදන්නත් ආසාවෙන් හිටියා.

ඔය අතරෙ දහම් එක්ක කතා කර කර හිටපු වෙලාවක එයා කිව්වා පහුගිය ටිකේ ගෙදර වියදම් සැර වුණ නිසා අප්‍රේල් මාසේ වියදම් පරිස්සමින් කරන්න ඕන කියලා. දහම් එහෙම කියද්දි මගේ සැලසුම් ටිකක් බොඳවෙලා යනවා වගේ දැනුණා. ඒත් කෝකටත් කියලා මං කරන්න හිතන් ඉඳපු දේවල් ටික එයා එක්ක කියද්දී, පොඩ්ඩක් සැරට වගේ කිව්වා **"හැමදේම කරන්න බෑ. ඇයි තේරුම් ගන්න බැරි? අප්‍රේල් දරුවෝ ඉස්කෝලේ අලුත් වසරට යනවා. ඒවට ඕන කරන දේවල් ගන්න ඕනේ. ගොඩක් වැඩ තියෙනවා"** කියලා.

දහම් ඒක කිව්ව විදියට මගේ හිත පොඩ්ඩක් රිදුණත්, ඉස්සර වගේ අඬාගෙන දොඩාගෙන ඒවාට එකට එක කියාගෙන යන පුරුද්දක් දැන් මට නෑ. ඒ නිසා මං සද්ද නොකර අහන් ඉඳලා, තනියම හිතලා බැලුවා. අමාරුම නැත්තම් දහම් මට කවදාවත් මෙහෙම කියන්නේ නෑ කියලා මං දන්නවා. මං හිතන්නෙ දහම් වගේම තමන්ගෙ පවුලට අංක එක දීපු කිසිම මහත්තයෙක් අමාරුම වෙලාවක නෙවෙයිනම් එහෙම කියන්නෙ නෑ. ඉතින් ඒ විදියට මං හොඳ පැත්තට හේතු හොයද්දී එයාම මං ළඟට ඇවිත් කිව්වා, **"රෝසි අමාරු වෙලාවට අපිට නැතුව ජීවත් වෙන්න පුළුවන් දේවල් ගැන නොහිතා ඉමු. අපි පස්දෙනාටම එක වගේ බතික් ඇඳුම් තිබුණේ නෑ කියලා අපිට අවුරුදු සමරන්න බැරිකමක් නෑනේ. අනික අවුරුදු කියන්නේ පුළුවන් තරම් වියදම් කරලා සමරන්න ඕන දෙයක් නෙවෙයි. තමන්ට පුළුවන් විදියට තියෙන දෙයින් කැවිලි ටිකක් හදලා, එක මේසේ කට්ටිය ඉඳගෙන නැකතකට කෑම කාලා, වැඩ අල්ලලා, ගණුදෙනු කරන එකනේ. ඒකට ලොකුවට ලෑස්ති වෙලා අවුරුදු මාසේ අනිත් දවස් ටික අමාරුවෙන් ගෙවන්නේ මොකටද? ඔයා දරුවෝ සතුටු කරන්නයි මේ දේවල් කරන්නේ කියලා දන්නවා. ඒත් අපි ඒ දේ කරන්න ඕනේ අපිට පුළුවන් විදියට. අපි අවුරුදු සැමරන්න ලෑස්ති වුණාට ජපානෙට අවුරුදු නෑනෙ. 14 සාමාන්‍ය දවසක්. ඒ නිසා අපි අපිට පුළුවන් දේ කරලා ඒ දවස ලස්සන කරගමු. ඉස්කෝලේ පටන් ගන්න නිසා දරුවන්ට ගන්න තව ගොඩක් දේවල් තියනවානේ"** කියලා ගොඩක් ආදරෙන් මට කිව්වා.

**අපි නිදහසට කාරණා කිය කියා තවත් අවුරුදු දෙක තුනක් මේක සමරන්නෙ නැතුව අමතක කරලා දැම්මොත්, අපි අපේ දරුවන්ට අමතක කරවන්නෙ අපේ මහ සංස්කෘතියේ කොටසක් කියන එකත් අපිට පිළිගන්න වෙනවා**

මං ජපානේ ජීවත් වුණත්, හිතින් ජීවත් වෙන්නේ ලංකාවේ. අපේ ඒ අවුරුදු අත්දැකීම මගේ දරුවන්ට දීලා, හදන කැවිලි ටිකක් ගේ අවට ජපන් මිතුරියන්ට දීලා අපේ කැවිලිවල රස දැනෙන්න දෙන්නත් මං ආසයි. ඒකෙන් මං අලුත් කරගන්නේ පුංචි කාලේ මතක. නැකතට කිරි උතුරලා, මේසෙම පුරවපු කිරිබත් කැවිලි එක්ක, කෑම මේසේ පොල්තෙල් පහන මුලින්ම පත්තු කරන්නේ තාත්තා. ඊටපස්සේ අපිටත් පත්තු කරන්න දීලා, මුල් කිරිබත් කට තාත්තා අම්මාට කවනවා. ඊළඟට මටයි අයියටයි කවනවා. අම්මා තාත්තාට බුලත් දීලා වඳිනවා. ඒකම අපිත් කරනවා. ඊටපස්සේ කැවිලි පිඟන් අරන් සිංහල ගෙවල්වලට විතරක් නෙවෙයි හින්දු, මුස්ලිම් හැම ගේකටම කැවිලි බෙදනවා. මේක ලියද්දී මගේ ඇස් ඉස්සරහා ඒ සුන්දර අතීතේ මැවෙනවා.

ඒ දේවල් ඒ විදියටම මෙහේ කරන්න බැරි වුණත් පුළුවන් විදියට කරලා දරුවන්ට සුන්දර මතක එකතු කරන ආසාවක් මට තියෙනවා.

ලංකාවේ දැන් පවතින තත්ත්වය එක්ක, අවුරුදු සමරන්න තිබ්බ ආසාව පොඩ්ඩක් අඩු වුණා. ඒත් ඒ කිසිම දෙයක් නොදන්න මගේ දරුවෝ වෙනුවෙන්, පුංචියට හරි කෑම මේසයක් ලෑස්ති කරන එක අනිවාර්යයෙන්ම මම කරනවා. අපිට ලංකාවට ඇවිත් දරුවෝ එක්ක අවුරුදු සමරන්න බෑ. ඒ දරුවන්ගේ පළමු පාසල් වාරය හැම අවුරුද්දකම අප්‍රේල් මාසේ වසන්ත කාලයේ නිවාඩුවෙන් පස්සේ පටන් ගන්න නිසා.

ඇත්තටම අන්තිම සතේට හිඳෙනකම්ම වියදම් කරලා සමරන එකට නෙවෙයි අවුරුදු කියන්නේ. ඒ දේ මේ අවුරුද්දට විතරක්ම නෙවෙයි හැම අවුරුද්දකටම වැදගත් කියලා මට හිතුණා.

පහුගිය අවුරුදු දෙකේම කොරෝනා වසංගතය නිසා අපි කාටත් හිතේ හැටියට අවුරුදු සමරගන්න බැරිවුණා. මේ අවුරුද්දෙ ලංකාවේ ඉන්න අයට හිතෙන්න පුළුවන් එදවේල කන්න බොන්න කීයක්හරි හොයාගන්න අමාරු වෙච්ච එකේ, ගෑස් පෝලිම්, තෙල් පෝලිම්වල ඉන්න ගමන් මොන අවුරුදුද කියලා. හැබැයි මගේ නම් ඉල්ලීම, හයක් හතරක් නොදන්න දරුවන්ට මේ අවුරුද්දෙත් ඒ නැතිබැරිකම් දැනෙන්න දෙන්න එපා කියන එක. අපේ අමාරුකම්, අපේ නැතිබැරිකම් ගැන අපි දරුවන්ට තේරුම් කරන්න ඕන තමයි. ඒත් සිංහල අලුත් අවුරුද්ද ඒකට වෙලාව නෙවෙයි කියලයි මට හිතෙන්නෙ.

මම ගත්තොත්, මම දැන් ඉන්නෙ ලංකාවෙ නෙවෙයි. මගේ දරුවෝ ලංකාවේ අවුරුදු සමරන හැටි දැකලත් නෑ. ඒ නිසා ප්‍රශ්නයක් නෑනේ කියලා හිතලා අවුරුද්ද සමරන්නෙ නැතුව ඉන්න කාරණා ඕනතරම් හොයාගන්න පුළුවන්. හැබැයි අදටත් මට ඒ චාරිත්‍ර වාරිත්‍ර අමතක කරන්න බැරිවෙලා තියෙන්නෙ ඒ කාලේ අපේ අම්මලා, තාත්තලා අඩුවක් පාඩුවක් නැතුව අවුරුදු සමරපු නිසා සහ අපිට ඒවයේ වටිනාකම් කියලා දීපු නිසා. ඒ නිසා මේක සමරන්නෙ නැතුව ඉන්න කාරණා දහක් තිබුණත් එක හේතුවක් හරි හොයාගෙන පුංචියට හරි අවුරුදු සමරන්න. මොකද අපි නිදහසට කාරණා කිය කියා තවත් අවුරුදු දෙක තුනක් මේක සමරන්නෙ නැතුව අමතක කරලා දැම්මොත්, අපි අපේ දරුවන්ට අමතක කරවන්නෙ අපේ මහ සංස්කෘතියේ කොටසක් කියන එකත් අපිට පිළිගන්න වෙනවා.

**හෂිණී මනමේන්ද්‍ර**





# නෝනගෙයි මහත්තයගෙයි රණ්ඩුවකට පස්සෙ Google Map හැදුනෙ මෙහෙමයි

සුන්දර් පිචායි (Sundar Pichai) ඉපදුණේ අසල්වැසි ඉන්දියාවේ මදුරායිවල. ඒ 1972 අවුරුද්දේ ජූනි 10 වෙනිදා. කාලයත් එක්ක ඔහු ඇමෙරිකානු පුරවැසිභාවය ලබාගෙන ඇමෙරිකාවට පදිංචියට ගියා. හැබැයි ඒ ගියේ අංජලී පිචායි (Anjalee Pichai) කියන තරුණිය සමඟ විවාහවීමෙන් පස්සෙ. එහෙට ගිහින් කොච්චර සතුටින් පවුල් කෑවද කිව්වොත් දෙන්නට දෙන්නා හිටියේ හරියට ගහයි පොත්තයි වගේ. ඒ තරම් බැඳීමක් සුන්දර් සහ අංජලී අතර තිබුණා.

ඔහොම ඉන්නකොට 2004 අවුරුද්දේ දවසක රෑ කෑමක් වෙනුවෙන් සුන්දර්ගේ ළඟම මිතුරෙක්ගෙන් ඔහුට ආරාධනාවක් ලැබුණා. මිතුරා ඔහුට පැවසුවේ බිරිඳත් සමඟින්ම එදිනට පැමිණෙන ලෙස. ඒත් එතැනදි ඔහු පොඩි ගැටලුවකට මුහුණ දුන්නා. ඒ යාළුවා කියපු දවසට දෙදෙනාටම නිවසේ සිට එකට යෑමට නොහැකිවීම. ඒ නිසා සුන්දර් කාර්යාලයේ සිට කෙළින්ම මිතුරාගේ නිවසට යන්නත්, බිරිඳ නිවසේ සිට මිතුරාගේ නිවසට පැමිණෙන්නත් තීරණය කරගත්තා.

අදාළ දිනයේදී සුන්දර්ගේ බිරිඳ රාත්‍රී අට වනවිට සැමියා කී පරිදි ඔහුගේ මිතුරාගේ නිවසට ගියත් සුන්දර් ඇවිත් හිටියේ නෑ. ඇය පැය කීපයක් බලන් හිටියත් සැමියා එන පාටක් තිබුණෙත් නෑ. මෙච්චර ආදරේ කරලත් ඔහු තමාට ඇස් රතුවෙන විහිලුවක් කළා කියලයි ඇයට හිතුණේ. ඒ වෙලාවේ නම් අංජලීගේ රතු කට්ට පැන්නා. ඇයට කොච්චර තරහා ගියාද කිව්වොත් රාත්‍රී ආහාරය ගත් ගමන්ම ඇය තත්පරයක් හෝ නොසිට යළිත් තමන්ගේ නිවස බලා ගියා. ඒ ගියෙත් සුන්දර්ට හොඳවැයින් දෙකක් කතා කරන්න බලාගෙන.

අංජලී කොච්චර තරහා ගත්තත් ඔය අතරතුරේ සුන්දර්ට ලොකු අකරතැබ්බයක් වෙලයි තිබුණේ. නියමිත වෙලාවට ඔහු කාර්යාලයෙන් පිටවුණත් මිතුරාගේ නිවස සොයාගත නොහැකිව ඔහුට ටිකක් රස්තියාදු වෙන්න වුණා. රාත්‍රී 8.00ට මිතුරාගේ නිවසට යන්න පාරට බැහැපු සුන්දර් අන්තිමේ පාර හොයාගෙන එහෙට යද්දි රාත්‍රී 10.00ත් පහුවෙලා. වැඩේ කියන්නේ ඒ යද්දි බිරිඳ අංජලී ආපහු නිවසටත් ගිහින්. ඉතින් ඔහුට ඇතිවුණේ ඇය ගැන පුදුමාකාර දුකක්. ඒ නිසා ඔහු තීරණය කළා කෑමට නොසිට පුළුවන් ඉක්මණින් නැවත නිවස බලා යන්න.

සුන්දර් නිවසට යද්දී වෙනද වගේ හිනාමුසු මුහුණින් නම් නෙවෙයි අංජලී දෙර ඇරගෙන ඉදිරියට ආවේ. ඇය ආවේ යකා වැහුනු ගාණට තදවෙලා. අන්තිමේ දෙන්නා හොඳටම රණ්ඩුවෙලයි නැවතුණේ. සුන්දර් නියමිත වේලාවට නොපැමිණීම නිසා ඇය මිතුරාගේ නිවසේදී අපහසුතාවයට පත්වූ බව කියමින් ඇය ඔහුට බැණ වැදුනා. කවදාවත් කේන්ති නොගත් බිරිඳගේ මේ හැසිරීම නිසා සුන්දර්ට තවදුරටත් නිවසේ රැඳී ඉන්න හිතුණේ නෑ. ඒ නිසා ඔහු තීරණය කළා නැවත ඔහුගේ කාර්යාලයට යන්න.

> **රෑ 8ට එනවා කියලා පොරොන්දු වුණාට ඔහුට එතැනට එන්න පුළුවන් වෙලා තිබුණෙ රෑ 10ට. ඒවෙනකොට වයිෆ්ට හොඳටම තරහ ගිහින් ඇය පිටත්වෙලා**

සුන්දර් එදා මුළු රාත්‍රියම ගතකළේ කාර්යාලයේ. වෙච්ච සිද්ධිය නිසා ඔහුට නිදාගන්නත් හිතක් තිබුණෙ නෑ. ඇත්තටම කිව්වොත් සුන්දර් මුළු රාත්‍රිය පුරාම හිතුවේ තමන්ට පාර වැරදිලා වෙච්ච අකරතැබ්බය ගැන. කොච්චර දුරකට හිතුවද කිව්වොත් තමන්ට වගේ තව කී දෙනෙක්ට මෙහෙම දේවල් වෙනවා ඇතිද කියලා ඔහුට හිතුණා. අවසානේ ඔහු තීරණය කළා ඒකට පිළියමක් යොදන්න.

රාත්‍රිය ගෙවිලා අලුත් දවසක් උදාවුණත් සුන්දර්ට නිවසට යන්න නම් හිතක් තිබුණෙ නෑ. මොකද ඔහුට ඕනෙ වුණා තමන්ට වද දුන්න ප්‍රශ්නයට උත්තරයක් හොයාගෙනම නිවසට යන්න.

ඔහුගේ හිත කිව්වෙම සිතියම සාක්කුවේ තියෙනවා නම් ඒ ඔස්සේ දිශාව නිවැරදිව බලාගෙන නිවැරදි ස්ථානයට යන්න පුළුවන් කියලයි. ඒක ඔලුවේ තියාගෙන සුන්දර් ඊළඟට කළේ තමන්ගේ කණ්ඩායම කැඳවලා ඒ ගැන ඔවුන්ව දැනුවත් කරන එක. මුලදි ඔවුන් ඒ අදහසට හිත යටින් හිනාවුණත් පස්සේ පස්සේ ඔවුන්ටත් හිතුණා ඒක ප්‍රයෝජනවත් වැඩක් කියලා. ඊටපස්සේ හැමෝම එකතුවෙලා වැඩේ පටන්ගත්තා.

ඒ 2005 අවුරුද්ද. සුන්දර් තමන්ගේ කණ්ඩායමත් එක්ක එකතුවෙලා දැඩි පරිශ්‍රමයකින් පස්සේ අතරමං නොවී හිතෙන තැනකට යා හැකි සිතියමක් නිර්මාණය කළා. ඔවුන් ඒකට නම් තැබුවේ **'ගූගල් සිතියම'** (Google Maps) කියලා. 2005 අවුරුද්දේ ඇමෙරිකාවේ හදපු ඒ සිතියම ඔවුන් 2006 අවුරුද්දේ එංගලන්තයේදී වගේම 2008 අවුරුද්දේ ඉන්දියාවේදීත් අත්හදා බැලුවා. අවසානේ ඒ ඒ රටවල්වලට තේරුම් ගියා සුන්දර්ගේ කණ්ඩායම හදපු ගූගල් සිතියම මුළු ලෝකයටම නිවැරදි මාවත පෙන්වන වැදගත් වැඩක් කියලා. ඒ නිසා සුන්දර්ගේ ගූගල් සිතියමට කෙටි කාලයක් ඇතුළත ලෝකය තුළින්ම ලොකු ඉඩක් ලැබුණා.

> **මුලදි ඔහුගේ කණ්ඩායමට කතා කරලා මේ අදහස කියද්දි ඒ අයත් හිනාවෙලා**

සැමියගෙයි බිරිඳගෙයි රණ්ඩුවක් නිසා අපිත් නිතර නිතර පාවිච්චි කරන ගූගල් සිතියම හැදුනේ එහෙමයි. ඒ වෙනකොට සුන්දර් කියන්නේ ගූගල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියෙක්. ඒ නිසා ඔහුට ඔහුගේ දැනුම සහ ගූගල් ආයතනය සතු සුපිරි තාක්ෂණය මේ වැඩේට භාවිතා කරන්න හැකියාව ලැබුණා. අද වෙනකොට ලෝකයේ සෑම පුද්ගලයින් හත්දෙනෙක් අතරින් එක් පුද්ගලයෙක් මේ ගූගල් සිතියම භාවිතා කරන බව සඳහන්. මේ වගේ වැඩකට ඇති වැඩ සිද්ධ වෙනවනම් ඉතින් දෙන්න දෙමහල්ලො අතරෙ පොඩි පොඩි රණ්ඩු සරුවල් ඇතිවුණත් මොකද ඉතින්... නේද?


සුන්දර් සිය බිරිඳ අංජලී සමඟ

**රුවන් එස්.සෙනවිරත්න**


OTTO®
BATHWARE
පවතී සැමදා
දිවයින පුරා ප්‍රදර්ශනාගාර හා අලෙවි නියෝජිතයන්
ක්ෂණික ඇමතුම්: 0706 570 570
info@ottobathware.com | ottobathware.com

# මැරෙනකන් ඉන්න විතරක්වත් ඉඩ දෙන්න කියන්න මහත්තයෝ

## ගේ ලියාගත් පසු පුතා විසින් දොට්ට දැමූ දෙමාපියන්ගෙන් ඉල්ලීමක්

**සිදුවන අඩම්තේට්ටම් ගැන කියන්න වියපත් අම්මයි, තාත්තයි පොලිසි ඇවිත්**

**“අපි ලොකු අවනඩුවක් කියන්නයි මහත්තයෝ පොලිසියට ආවේ. පුතයි, ලේලියි අපට ගෙදරින් යන්න කියලා ගහනවා, බණිනවා. ඊයේ පෙරේද දවසක පුතා මගේ බෙල්ලත් මිරිකුවා.”**

නිට්ටඹුව පොලිසියට පැමිණි හැට හය හැවිරිදි මාතාවක් තම දුක්ගැනවිල්ල කියන්නට වූයේ කඳුළු සලමිනි. ඈ අසළ සිටියේ හැට නව හැවිරිදි ඇයගේ සැමියායි.

මේ කියන පුතා සේවය කරන්නේ ගුවන් හමුදාවේය. පුතුගේ බිරිඳ ග්‍රාම නිලධාරිනියකි. වයස අවුරුදු හතර හමාරක හා මාස අටක දරු දෙදෙනෙක්ද එම යුවළට හිඳී. එම දරු පැටවුන්ගේ සුරතල් දකිනවිට මෙම අම්මාටත්, තාත්තාටත් සිහිපත් වන්නේ තම එකම පුතු ඇතුළු දරු තිදෙනා කුඩා කාලයේ ආදරයෙන් ලොකු මහත් කළ හැටිය. අද නපුරු වී ඇතත්, පුතු උපන්දා ඔවුන් සතුටු වූයේ රටක් රාජ්‍යයක් දිනුවා මෙනි.

**“අපි දරුවෝ පොඩි කාලේ පදිංචි වෙලා හිටියේ හඟුරන්කෙත. එයාලා ලොකු මහත් වෙලා රස්සාවලට ගියා. ආවාහ විවාහ කරගත්තා. පුතා ගුවන් හමුදාවට බැඳුණාම කටුනායකට ළඟ නිසා එයාගේ පහසුව ගැන හිතලා නිට්ටඹුව කිට්ටුවෙන් ගෙයක් මිලට ගත්තා. ඒ 2013 අවුරුද්දේ.”**

තම පුතුගේ දුකසැප බලා කියාගෙන සැඳෑසමය සතුටින් ගතකිරීමේ අදහසින් සිටියත්, ඔවුනගේ ඒ සිහින එකිනෙක බිඳ වැටෙන්නට පටන්ගත්තේය. ලේලිය මුලදි මුලදී මේ දෙන්නා දෙමහල්ලන්ට වෙනස්කමක් නොකළත් ඇයගේ මවද එම නිවසේ පදිංචියට ආවෙන් නැති ආරෝවන් ඇතිවන්නට එයද එක් හේතුවක් විය.

පුතුට මෙම නිවස අලුත්වැඩියා කරන්නටත්, මෝටර් රථයක් මිලදී ගන්නටත් අදහසක් එන්නේ මේ අතරය.

**“පුතා කිව්වා ගේයි, ඉඩමයි නීත්‍යානුකූලව එයාට පැවරුවොත් බැංකු ණයක් ගන්න පුළුවන් කියලා. මමත් මහත්තයත් ඒකට අකමැති වුණේ නෑ. දරුවෙක් හොඳින් ඉන්නවට දෙමාපියෝ කැමතියි. අපි දෙන්නා කතාවෙලා පුතා නමට ගේයි, ඉඩමයි ලියලා දුන්නා.”**

එසේ තමා සතු එකම දේපළ පුතු නමට ලියාදීමෙන් පසු දින සති මාස ගෙවෙද්දී ඔවුන් සිටින්නේ තවදුරටත් තමාගේ නිවසක නොවේ යැයි යන සිතිවිල්ලක් ඔවුන්ට නොදැනුණාම නොවේ.

ග්‍රාමසේවක ලේලියද මේ දෙන්නා දෙමහල්ලන්ගේ නැති වැරදි සොයන්නට වූයේ ඔවුන් තව තවත් අසරණ කරමිනි. ඇය පල නොකියා පළා බෙදන්නට වූයෙන් ඔවුන් සිටියේ කණගාටුවෙනි.

**“අපි පුළුවන් තරම් ඉවසුවා. පාඩුවේ ඉන්න උත්සාහ කළා. කන්න බොන්න ගියත්, අපි ගේ ඇතුළේ එහෙට මෙහෙට ගියත්, වැරැද්දක් විතරයි හෙව්වේ. ලේලිගේ අම්මත් පුතයි, ලේලියි අපට බණිද්දි ඇවිලෙන ගින්නට පිදුරු දන වැඩ කරනවා.”**

ඇය කීවේ සැමියා දෙසද බලමිනි. ඒ දෑස්වල බොරපාට කියන්නේ පුතෙකු හිතා හෝ නොසිතා දෙන වධවේදනා විය හැකිය. එහෙත් මෙම දෙමාපියන්ට තම දේපළ පුතුට ලියාදීම ගැන දුකක් නැත. ඒ එය හොඳ හිතින් පුතුගේ යහපත ගැන සිතා කළ දෙයක් බැවිනි.

කෙසේ වුවත් තම වයෝවෘද්ධ දෙමාපියන්ට එහි අයිතියක් නැති බව හඟවන වචනද පුතුගේ මුවින් පිටවූ අවස්ථා තිබේ. ඒ පසුපස ඇතැම් අවස්ථාවල සිටියේ ලේලිය නමුත්, මේ දෙන්නා දෙමහල්ලෝ කාටත් කියාගත නොහැකි දුක් තනිව බෙදාගත්තේ ඒ ගැන කිසිවෙකුට හෝ කීම හොඳ නැති බැවිනි.

කෙසේ හෝ මොවුන්ගේ අඩදබර වැට පැන අසල්වැසි නිවෙස් වෙතද පියමං කරන්නේ, මෙම දෙන්නා දෙමහල්ලෝද තමන්ට වන අසාධරණය, වධ හිංසා ඉවසාගත නොහැකිව වචනයක් දෙකක් කී විටය. එසේ කතා කළහොත් පුතත් ලේලියත් තව වැඩි වැඩියෙන් අහිංසක යුවළට හිරිහැර කිරීම පුරුද්දකි.

**ටික දවසකට කලින් පුතා අම්මගේ බෙල්ල මිරිකලා, විදුලි පංකාවෙනුත් ගහලා**

**“මේ පහරදීම් ගැන අවස්ථා දෙකකදී අපිට පැමිණිලි ලැබුණා. පසුගිය දවසක මේ පුත්‍රයා ආරවුලක් අතරතුර මවටත්, පියාටත් පහර දී තිබෙනවා. එහිදී මෙම පුතා මවගේ ගෙල මිරිකලා, මුඛය මිරිකලා බිත්තියට හේත්තු කරගෙන ඇයට පහර දුන් බවට මව පැමිණිලි කළා.**

**එම අවස්ථාවේ නිවසේ වූ විදුලි පංකාවකින්ද පුතා ඇයට පහර දී තිබෙනවා. එම අවස්ථාවේ ලේලිත් නැන්දම්මත් පහරදුන් බවට එම පැමිණිල්ලේ සඳහන්. අදාළ පුතා ග්‍රාම නිලධාරිනිය වාගේම ඇගේ මවත් එම පැමිණිල්ලට අනුව අත්අඩංගුවට ගනු ලැබුවා.”**

පොලිසිය සඳහන් කරන්නේ එම පහරදීමෙන් අදාළ මව දැඩිලෙස රෝගාතුර වී ඇති බවය. ඇය වතුපිට්වල රෝහලට ඇතුළත්ව දින හතරක කාලයක් ප්‍රතිකාර ලබන්නේ අදාළ පහරදීමෙන් ඇතිවූ සංකූලතා මෙන්ම කම්පනයද නිසාවෙනි.

මේ අතර පුතුද පියාට එරෙහිව පැමිණිලි දෙකක් කර ඇත.

ඊටද හේතුවී ඇත්තේ මම ආරවුල ඇතිකළ නිවසේ අයිතිය පිළිබඳ කතාවයි. තමන් ජීවිත කාලයේම දුක් විඳ අන්තිමට ඉතුරු වූ නිවසද අහිමි වී යාමෙන් අසරණව ගිය කල ගේ යළි තමන්ට නොපවරන්නේ නම් නිදහසේ මියෙනතුරු එහි ඉන්නට දෙන්නැයි ඔහු පුතුගෙන් ඉල්ලීම් කර තිබේ. මේවාටද පුතුට හොඳහැටි තරහා එන්නේය. අම්මා තාත්තා අතදරු වියේ සිට තමන්ව ලොකු මහත් කරන්නට විඳි දුක්ගැහැට බිඳක්වත් ඔහුට ඒ මොහොතට මතක නැත. වයසට ගියත් තණ්හාව යැයි ඔහු මව්පියන්ට බැණ වදින්නේය.

**“මේ දෙමව්පියෝ දෙන්නා ගෙදරදී විවිධ හිංසාවන්ට ලක්වෙනවා කියලා ගම්වැසියෙක් දෙන ලද දිවුරුම් ප්‍රකාශයකුත්, දස දෙනෙක් අත්සන් කළ ලිපියකුත් පැමිණිල්ල විභාග කරන මොහොතේ මොවුන් ඉදිරිපත් කළා. සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුට ගත් සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතයි.”**

නිට්ටඹුව මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.ඕ.පී.අබේරත්න මහතාගේ උපදෙස් පරිදි අදාළ සිදුවීම පිළිබඳ පැමිණිල්ල විභාග කෙරිණි.

නිට්ටඹුව පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බුද්ධික නිලන්ත, උපපොලිස් පරීක්ෂිකා සාරංගි ජයසිංහ, උපපොලිස් පරීක්ෂක පී.එල්.එල්. ආර්.සමරකෝන් යන මහත්ම මහත්මීන් විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන පැමිණිල්ල විමර්ශනය කොට තිබුණි.

මේ අපට අසන්නට ලැබූ එක් කතාවක් පමණි. එළිපිටට නොඑන මෙවැනි සිදුවීම් නිසා දුක් සුසුම් හෙළන මාපියන් ඕනෑතරම්ය. තම ආදරණීය දෙමාපියන් වියපත් වෙද්දී, ඒ දෙමාපිය හිත්වලට සැනසිල්ලක් දෙන්නට හැකි කාරුණික ආදරණීය දරුවෙක් විනා, තමන් හැදූ වැඩූ දෙමාපියන්ට හිංසා කරන සිත්පිත් නැති දරුවෙක් මේ මිහිමඬල අපේක්ෂා කරන්නේ නැත.

එවන් දරුවෙක් මේ මිහිමතට බරකි. ඒ බරැති දරුවා නොවී, තම වියපත් මාපියන් දෙස කාරුණිකව බැලිය හැකි ආදරණීය දරුවෙක් වන්න.

**සැරයන් පුතත්, ග්‍රාම නිලධාරී ලේලියත්, ලේලියගේ මවත් පොලිස් අත්අඩංගුවට**



**දීපා වසන්ති එදිරිසිංහ**




SLT-MOBITEL MOBILE
PREPAID සහ POSTPAID
පාරිභෝගිකයින් හැමෝටම,

හිත ඇති කියනකං SCROLL කරන්න
ඇඟිලි ඇති කියනකං CHAT කරන්න
ඇස් ඇති කියනකං VIDEO බලන්න

ඔබ කැමතිම ඇප් 9ට ඇති වෙනකං data
සහ වැඩිපුර 2GB අමතරව.


රුපියල් 398කට #170# අමතා හෝ
SELFCARE APP එක හරහා දැන්ම ඇක්ටිවේට් කරගන්න.

*කොන්දේසි සහිතයි. TRC/M/PRO/20/07

www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව

# ජා ඇල පොලිසියෙන් යකින්නක් අල්ලලා නඩුවක් දාලා



මෙරට කොවිඩ් වසංගතය පැතිරෙන්නට ගත් මුල් කාලයේ ජාඇල, සුදුවැල්ල ප්‍රදේශය මුල්කොටගෙන මහත් ආන්දෝලනයක් ඇතිවිය. ඒ එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් කොවිඩ් ආසාදිතයන් වශයෙන් හඳුනාගැනීමත් සමඟිනි.

වර්තමානයේ ජනාකීර්ණ ප්‍රදේශයක් වුවද මීට දශක හතර පහකට ඉහතදී සුදුවැල්ල, සුදුවැලිවලින් පිරීගත් ඉතා මනරම් පරිසර පද්ධතියකි. දුරාතීතයේ මුහුද ගොඩගැලීම නිසා සුවිසල් ප්‍රදේශයක් පුරා පැතිරුණු වැලි නිධියක්ව පැවති සුදුවැල්ලේ ඕලු, නෙළුම්, මානෙල් ආදියෙන් සුසැදි කුඩා විල් දහයක් පහළොවක් හෝ ඊට වැඩි ගණනක් දක්නට ලැබිණි.

තැනින් තැන හමුවන පිහිටි පොළොවේ වැටී ඇති උස් ගස් හැරුණුකොට සුදුවැල්ලේ රාත්‍රී කාලයට දක්නට ලැබෙන අද්භූත ගැහැනියකගේ අවතාරයක් පිළිබඳව මුල්වරට මට කරුණු කීවේ එවක ජාඇල ජයන්ති විද්‍යාලයේ විදුහල්පතිව සිටි එම්.ටී.ධර්මසේන මහතාය. එවක එම පාසලේ ඉගෙනුම ලැබූ සිසුන්ගේ පියවරුන් කිහිපදෙනෙකුම එම අවතාරය දැක බියපත් වූ බවද ඔහු කීය.

එමෙන්ම සුදුවැල්ල ආශ්‍රිතව සුදුවැලි පොකුණ නම් කුඩා ජලාශයක් ඇති බවටත්, එය අතීතයේ එහි රජකම් කළ රැජිනක් දිය නෑමට යොදගත් රාජකීය පොකුණක් බවටත් සුදුවැල්ල අවට ජීවත් වූ පාරම්පරික වැසියන් අතර විශ්වාසයක් තිබූ බව ධර්මසේන මහතාගෙන් අසා දැනගැනීමට මට හැකි විය. එමෙන්ම එම රැජින දියට බැසීම පිණිස යොදගත් ගල් පඩිපෙළක් හා ගල් පුවරුවක් අතීතයේ ඉස්මතුව තිබී කාලයාගේ ඇවෑමෙන් වැල්ලට යටවී ඇති බව ගැමියන් පවසන බවද හෙතෙම කීය.

**කුවේණිගෙ නංගි 'අල්ලි රාණි'ගෙ මාලිගාවේ නටඹුන් තියෙන්නෙ කල්පිටියේ**

අනුව දශකයේ මුල් භාගයේ අවස්ථා කිහිපයකදීම සුදුවැල්ලේ සංචාරය කරන්නට අවස්ථාව ලැබුණත් මට ඒ තොරතුරු නිසි පරිදි අසාගත නොහැකි වූයේ ඒ වනවිට එහි පදිංචිව සිටි පිරිස මුළුමනින්ම පාහේ පිට පළාත්වලින් පැමිණි සංක්‍රමණිකයන් වීම නිසාය.

එහෙත් 2006 වසරේ බෝපිටියේ මුතුරාජවෙල පරිසර කේන්ද්‍රයේදී මට හමුවූ එන්.ඩී.කේ.පෙරේරා නම් වන දැලතුර ප්‍රදේශයේ ගැමියෙකුගෙන් සුදුවැල්ලේ දක්නට ලැබෙතැයි පැවසෙන අද්භූත ගැහැනිය පිළිබඳව වැඩිදුර යමක් දැනගත හැකි විය.

**"ඔය සුදුවැල්ල වගේම වැලිගම්පිටිය, වැලිසර වගේ පළාත් සුදුවැලිවලින් වැහිලා තියෙන්නේ කැලණිතිස්ස රජ්ජුරුවන්ගේ කාලේ විහාරමහාදේවි සම්බන්ධ මූද ගොඩගලපු සිද්ධියෙන් කියලයි අපේ පරණ මිනිස්සු කිව්වේ.**

**අදත් ඔය සුදුවැල්ලේ වැලි අතරේ දිරාගිය සිප්පි කටු, කවඩි වගේ දේවල් හම්බුවෙනවා. සුදුවැල්ලේ ඔය කියන රැජිනගේ මාලිගාව තිබිලා තියෙන්නේ ඊටත් හුඟාක් කලින්ලු. පස්සේ ඒ මුහුද ගොඩගැලීමෙන් ඒ මාලිගාව මුහුදට ගහගෙන ගියාලු.**

**නමුත් පහුකාලෙකදී ඒ රැජින දිය නාපු පොකුණ ඔය සුදුවැල්ලෙන් මතුවෙලා තියෙනවා. ඒ වගේම ඒ රැජින යක්ෂ ගෝත්‍රික කියලත් කියනවා. ඊටපස්සේ හඳ පායපු දවස්වල රෑට ඒ යක්ෂ රැජින කෙහෙවල්ලත් විදගෙන තමන්ගේ මාලිගාව තියෙන තැනට ඇවිත් හඬා වැළපෙනවා කියලා කතාවක් අපි පුංචි කාලේ අහලා තිබුණා. ඔය සුදුවැල්ලේ අදත් ඉඳලා හිටලා හඳ පායපු රෑට දකින්න තියෙනවාය කියන්නේ ඒ යක්ෂ රැජිනගේ අවතාරය කියලයි කියන්නේ."**

**අදත් ඔය සුදුවැල්ලේ වැලි අතරේ දිරාගිය සිප්පි කටු, කවඩි වගේ දේවල් හම්බුවෙනවා**

ඊට කලකට ඉහත විදුහල්පති ධර්මසේන මහතා කී ඒ අපූර්ව ප්‍රවෘත්තියෙහි පූර්වාපර සන්ධි පෙරේරා මහතා විසින් එසේ ගැලපීම සම්බන්ධයෙන් මා සිතට පිවිසියේ අතිමහත් ප්‍රබෝධයකි.

ක්‍රිස්තු පූර්ව හයවන සියවසට ඉහත අප රටේ යක්ෂ ගෝත්‍රිකයන් විසූ බවට ප්‍රකට මතයක් තිබේ. දේශීය වංශ කතා අනුව එවක අප රටේ කුවේණි නම් යක් රැජිනක් රජකම් කොට ඇත. එමෙන්ම කුවේණියගේ සොයුරියක ලෙස හැඳින්වෙන අල්ලි රාණි නම් යක් රැජිනකගේ මාලිගාවක නටඹුන් කල්පිටිය අර්ධද්වීපයේ පල්ලිවාසතුරෙයි ප්‍රදේශයේ තිබේ. ඒ අනුව පසුකාලීන අවතාරයක් ලෙස හඳුන්වන ලද්දේ දුරාතීතයේ සුදුවැල්ලේ විසූ එකී යක්ෂ ගෝත්‍රික නායිකාව විය නොහැකිද?

**"අපොයි ඔය කියන යක්ෂ රැජිනව ඉස්සර අපි මාස තුන හතරකට සැරයක් අල්ලලා නඩු දනවා. ඕනෙතරම් පොලිස් කූඩුවෙත් ඉඳලා තියෙනවා. මං හිතන්නේ හත් අට වතාවක් හිරේ ගිහිනුත් ඇති."**

ඉතා මෑත දිනයෙක තංගල්ලේ මංගල උත්සවයකදී මට අහඹු ලෙස හමුවූ විශ්‍රාම යාමට ආසන්නව සිටි පොලිස් සැරයන්වරයෙක් කීය. ඔහු එක්දහස් නවසිය අසූවේ මැද භාගයේ වසර කීපයක්ම ජාඇල පොලිසියේ කොස්තාපල්වරයෙකු ලෙස සේවය කළ අයෙකි.

**''ඉස්සර ඔය සුදුවැල්ල හරහා බෝපිටිය පැත්තට වැටෙන අඩිපාරක් තිබුණා. ඕකෙන් තමයි ජාඇල පැත්තට කසිප්පු ඇද්දේ.**

**ඒ කසිප්පු අදින පිරිස අතරේ කොණ්ඩෙ කඩාගත්තු යකින්නක් වගේ ගෑනු කෙනෙක් හිටියා. උදේ ඉඳලම බොන එකමයි ගෑනිගේ වැඩේ. ඔය කාලේ අපි කසිප්පු අල්ලන්න සුදුවැල්ලේ ඔය පාර අයිනේ හැංගිලා ඉඳලා ඔය ගෑනු කෙනාවත් නිතරම වගේ අල්ලලා තියෙනවා. ඒ කාලෙත් රෑට රෑට සුදුවැල්ලේ ඇවිදින ගෑනියෙක් ගැන කතා තිබුණා. ඒ යකින්නක් කියලත් සමහරු කිව්වා. කොහොමහරි යකැදුරෙක් නැතුව අපි ඒ යකින්නව ඇල්ලුවා විතරක් නෙවෙයි පොලිස් කූඩුවෙත් දලා තිබ්බා."** ඔහු කීවේ කොක් හඬලා සිනාසෙමිනි.

ඒ අනුව අප සමාජයේ පැතිර යන හොල්මන් අවතාර පිළිබඳ කතා මුළුමනින් මුසා බස් නොවනුයේ ඒවා අභ්‍යන්තරයේ මෙබඳු සත්‍ය සිදුවීම්ද සැඟවී ඇති නිසා බව කිව යුතුමය.



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

# මාලිගාවේ ඉන්දි රාජාට තවමත් හින්දි මතකයිලු


ඉන්දි රාජා

මහාචාර්ය අශෝක දංගොල්ල විශ්වවිද්‍යාල ආචාර්යවරයකු ලෙස සේවයට බැඳුණේ 1989 වසරේදීය. එකල රටේ පැවති කලබලකාරී වාතාවරණය හේතුවෙන් දෛනික ජීවන රටාව වෙනස්ව තිබිණ. එවකට පේරාදෙණිය පශු වෛද්‍ය පීඨ අංශාධිපති වූ මහාචාර්ය කුරුවිටගෙන් ඉරිදා දිනක දහවල් එකට පමණ හදිසියේම නවක ආචාර්යවරයාට ඉල්ලීමකි. ඒ චිකිත්සාගාරය වසා දමා යමුද යනුවෙනි. යන තැන නොදන්නේ වුවද **"හා, "යමු"** යන්න නවකයාගේ පිළිතුර විය. කිසිවක් නොවිමසාම හෙතෙම අංශාධිපතිගේ නවතම මෝටර් රථයට නැගුණේය.

විශ්වවිද්‍යාල සමාජ ශාලාවෙන් සහ පේරාදෙණිය තානායමේදී ද අංශාධිපති මධුවිතෙන් සප්පායම් වෙද්දී මහාචාර්ය දංගොල්ල කිසිවක් විමසුවේ නැත. **"අපි**

## අලි කතා

**දැන් යමු"** කී විට **"හා, යමු"** කීවා පමණි. කෙසේ වෙතත් නිවස වෙත යාම තිබියදී කොළඹ දෙසට වාහනය ධාවනය කරවද්දී බියට පත් වුවද ඔහු කිසිවක් නොඇසුවේය.

දෙවැනි ගියරයට දැමූ වාහනයේ ගියර් මාරු කිරීමක්ද නැත. ටික වේලාවකින් මහාචාර්ය දංගොල්ල නින්දට වැටුණේය.

නැවත ඇහැරෙන විට අංශාධිපතිවරයා මාර්ගයේ සෙසු සියලු රියදුරන්ට බැන වදිමින් රථය ධාවනය කරන බැවින් අඛණ්ඩව හෙතෙම මුනිවත රැක්කේය. ගමන නැවතුණේ අංශාධිපතිවරයාගේ දෙමාපියන්ගේ නුගේගොඩ නිවසිනි.

පාන්දර යාමයේ කිසිඳු දෙයක් නොදැන වෙනත් නිවසකට ගොඩ වැදී එහි නිදන්නට නවක ආචාර්යවරයාට සිදුවිය. පසුදා උදෑසන අපූරු දැනුම්දීමකිදී.

**"ඉන්දියාවෙන් ශ්‍රී දළදා මාළිගාවට ඇතෙක් පූජා කරලා. ඒ ඇතා කොළඹ වරායට ළංවෙලා. ඇතා බාරගන්න තියෙන උත්සවේට අපි දෙන්නා යන්න ඕනෙ."**

අංශාධිපතිවරයාගේ දැනුම්දීමෙන් මහාචාර්ය දංගොල්ලට උතුර දකුණ මාරු වූයේ එවැන්නකට කිසිඳු සූදානමක් නොතිබූ බැවිනි. සුදුසු ඇඳුමක්ද නැත. අංශාධිපතිගේ ඥාති සොයුරෙකු වූ ප්‍රසිද්ධ නාවික නිලධාරියකුගෙන් ආචාර්යවරයාට ඇඳුම් හිමිවිය.

උත්සව අවස්ථාවට දියවඩන නිලමේවරයාද සහභාගිව සිටියේය. එතැන චාම් උත්සවයකි. පසුව ඇත් පැටවා ලොරියකට පටවනු ලැබීය. ඊට පිටුපසින් දියවඩන නිලමේවරයාගේ සහ මහාචාර්ය කුරුවිටගේ වාහනද ගමන් ගත්තේය. ඇත් පැටවා පළමුව දෙහිවල සත්වෝද්‍යානය වෙත ගෙන ගොස් ආහාරපාන ලබාදීමට පියවර ගැනිණ. පසුව ඇත් පැටවා ශ්‍රී දළදා මාළිගාවට ගෙන යන ලදි. කිලෝග්‍රෑම් දහසක පමණ බරැති ඇත් පැටවාට පසුව **'ඉන්දි රාජා'** ලෙස නම් තැබිණ.


තොරතුරු -
**මහාචාර් අශෝක දංගොල්ල**
**(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)**

මෙම සිදුවීමෙන් වසර දහයකට පමණ පසු අලි පිළිබඳ සුප්‍රසිද්ධ ඉන්දීය වෛද්‍යවරයෙක් මෙරටට පැමිණියේය. හේ ලොව පුරා ප්‍රචලිත Doctor K. නමිනි. එවකට කෑගල්ලේ සිටි ඉන්දි රාජා බැලීමට Doctor K. පැමිණියේය. හෙතෙම බිම ඉඳගන්නා ලෙස ඉන්දීය බසින් ඉන්දි රාජාට අණ කළේය. ඉන්දියාවෙන් පැමිණ වසර දහයක් පමණ ගත වුවද ඉන්දි රාජා ඉක්මනින් ඊට ප්‍රතිචාර දැක්වීය. එතැන සිටි සියල්ලෝ ඉන් විමතියට පත්වූහ. ඉන්දි රාජාගේ තියුණු මතකය ගැන මහාචාර්ය දංගොල්ල විස්මයට පත්වුවද ඊට හේතුව දැනගත්තේ කලකට පසුය. අලින්ගේ මොළයේ තරමක් විශාල හිපෝකැම්පස් නම් ඉන්ද්‍රියක් ඇත. දීර්ඝකාලීන මතකයට අලියාට උදව් වන්නේ එයයි. වසර දහයකට එපිට මතකයට ඉන්දි රාජා සංවේදී වූයේ එබැවිනි.

**රෂ්නිකා ලියනගේ**



කවරයේ කතාව

# මහගෙදර අවුරුද්ද රසවත් කරපු ආච්චි අම්මගේ කැවිලි මේසේ තාම මතකයි

## කැවිලි ගෙදර නදී



පොඩ්ඩුව වෙෆ් කෙනෙක් වෙන්න කැමතිලු

අවුරුදු කාලයට හැම ගෙදරකම අවුරුදු ඇතත්, මහගෙදර අවුරුදු මතක තවමත් සිරියාවය. කොවුල් හඬත්, එරබදු වසන්තයත් මැද ඇසෙන නෑසියන්ගේ කිචිබිචිය වසරේ ඉදිරි මාස කිහිපයේ සතුට සමාදනය ගැන ඉඟියකි. නැකතට සිරිතට විරිතට මුල්තැන දෙමින් සමරන එවන් මහා සංස්කෘතික මංගල්‍යයක්, එකමුතුකමේ සමගියේ සෞභාග්‍යයේ අගය අපට මොනවට කියාදෙනු ලබයි.

සොබාදහම ගම්මැද්දේ අවුරුද්දට බොහෝ ආශිර්වාද ගෙනෙනා අතරම, අත්තම්මාගේ අවුරුදු කැවිලි මේසය රස මවන උල්පතකි. ඉන් ඇතැම් කැවිලි පෙවිලි කළුඑළි බසින්නේම අවුරුදු කෑම මේසය රස ගන්වන්නටය.

ගමට එවන් නෑකමක් ඇති අත්තම්මාගේ කැවිලි මේසයෙන්, කැවිලි රස ගැන හොඳින්ම දැනගත් නදී කොඩිකාරත් ඇගේ නිවුන් දියණියන් වන හරිනි එස්.කොඩිකාර සහ හසදි එස්.කොඩිකාර මෙවර 'ධරණී' අවුරුදු කලාපය සරසනු ලබයි. නදී කොඩිකාර සම්මානනීය ඡායාරූප ශිල්පී චතුර එස්.කොඩිකාරගේ බිරිඳය. H&S කැවිලි ගෙදර සිට ඔවුන් අවුරුදු රස ගැන රස මතක අවදි කළේ මෙලෙසිනි.

**"මගේ ආච්චි අම්මට දරුවෝ දහදෙනයි. ඉතින් අවුරුදු කාලෙට මහගෙදර මඟුල් ගෙයක් වගෙයි. දරු මුණුපුරෝ හැමෝම එකතුවෙන නිසා ලොකු කැවිලි මේසයක් ගෙදර හැදෙනවා. කොණ්ඩ කැවුම්, කොකිස්, මුං කැවුම්, ආස්මි, කිරි අලුවා, පැණි වළලු, අග්ගලා, කිරිබත්, කෙසෙල් එක්ක ඒ කෑම මේසය අදටත් මගේ මතකයේ තියෙනවා. ඉතින් ආච්චි ඒ කැවිලි හදද්දී මමත් උදව් වෙනවා. ඉස්කෝලෙ යන දවස්වල ඉඳලම මට ඒ හැම රසකැවිල්ලක්ම හදන හැටි ආච්චි අම්මා කියලා දුන්නා. එදා ඒ අල්ලගත්ත රස පදම අද මං මගේ අතේ හුරුවත් එකතු කරලා හොඳින් කරනවා කිව්වොත් හරි."**

නදී අපේ කතාබහ ඇරඹුවේ එලෙසිනි. තංගල්ල වීරකැටිය ගමේ උපන් ඇය විවාහයෙන් පසු පදිංචියට ආවේ ගම්පහ ඉඹුල්ගොඩටය. කලක් කොළඹ ෆාමසියක මුදල් අයකැමිවරියක ලෙස රැකියාව කළ ඇයට චතුර මුණගැහෙන්නේ මඟුල් ගෙදරකදීය. මඟුල් ගේ ඇයගේ මාමාගේයි. මාමාගේ හිතවතෙකු වූ චතුර ඔවුන්ගේ විවාහ මංගල්‍යයේ ඡායාරූප ගන්නට පැමිණ සිටියේය. ඒ හමුව වසර නවයක ආදරයක් වී, එකම නිවහනකට ඒමේ වාසනාව ගෙනෙන්නේය. ඒ 2008 වසරේදියි. දියණියන් දෙදෙනා පාසල් වයසට එද්දී, පවුලේ ආදායම වැඩිකරගත හැකි ස්වයං රැකියාවක් තිබුණානම් හොඳයැයි ඔවුනට සිතුණි.



දුවලා දෙන්නට තවම අවුරුදු දහයයි. එයාලටත් කොණ්ඩ කැවුම් හදන්න පුළුවන්

**"අවුරුදු දවස්වලට ගමේදි දැක්ක ලොකු කැවිලි මේසය වගේම, ගම්පහ ගෙදරත් අවුරුදු කැවිලි මේසයට කැවිලි වර්ග ගොඩක් තියෙනවට මම කැමතියි. ඉතින් මම කරන්නේ මම දන්න හැම රසකැවිල්ලක්ම හදනවා. ප්‍රවීණ ඡායාරූප ශිල්පී බන්ධු එස්. කෝඩිකාර කියන්නේ චතුරගේ තාත්තා. මහගෙදරදි ලොකු අවුරුදු කැවිලි මේසයක් නෑයෝ හිත මිතුරෝ වෙනුවෙන් එයාලත් ලෑස්ති කරනවාලු. ඉතින් අපි විවාහ වෙලා වෙන්වුණාත් ඒ කෑම මේසය ඒ විදියටම ගෙදර පිළියෙල කරනවට එයා කැමති වුණා. ඔය විදියට කැවිලි රසට හදන්න පුළුවන් එකේ අපි ඒ විදියේ ස්වයං රැකියාවක් පොඩියට පටන්ගමු කියලා යෝජනා කළේ චතුරයි."**

ඒ 2016 අවුරුද්දේය. ඒ වනවිට දියණියන් දෙදෙනා පෙරපාසල් වයසේයි. ඔවුන්ගේ වැඩකටයුතුද සොයා බලමින්, රසකැවිලි හදන්නට පටන්ගත්තත් එය අලෙවි කරන්නට තවත් පියවර කිහිපයක් තබන්නට තිබුණි. එකක් ව්‍යාපාරයක් ලෙස එය ලියාපදිංචි කිරීමය. අනතුරුව ලේබලයක් සැකසිය යුතුව තිබුණි.

**"මුලදි අපි ෆොටෝ කොපි කරලා තමයි ලේබල් ටික හදගත්තේ. චන්දන පෙරේරා මහත්තයා එයාගේ සුපර් මාර්කට් එකට කැවිලි දන්න අවස්ථාව හදලා දුන්නා. මුලදි සතියකට වරක් කැවිලි දැම්මා. පස්සේ ටික ටික ඉල්ලුම වැඩිවුණා. ඔහොම මඟුල් ගෙදරට, දානේ ගෙදරට වගේම අවුරුදු කෑම මේසෙටත් වෙනත් ඕනෑම උත්සව අවස්ථාවකටත් ගැලපෙන්න හොඳින් ප්‍රියමනාපව රසකැවිලි හදන්න පුළුවන් වුණා. ඒ විදියට අවුරුදු දෙක තුනක් යද්දි කොරෝනා ප්‍රශ්නේ ආවා. කොහොම හරි ඒ වෙලාවේ ගෙවල්වල කැවිලි පෙවිලි හදන්න අපහසුකම් තිබුණු අයගෙන් ඇණවුම් ගොඩක් ලැබුණා. අපි පුළුවන් විදියට ඒ සැපයීම කළා."**

මුල් කාලයේ කාඩ්බෝඩ් පෙට්ටිවල දමාගෙන ගොස් කඩවලට රසකැවිලි දමන්නට ඔවුනට සිදුවුණි. කැවිලි පෙට්ටි දකිනවිට රියදුරන් බස්රථ නොනවත්වා ගිය අවස්ථා තිබූ බවත්, ඇතැම් කාලවලට පැය විසිහතරම නිදි මරාගෙන වැඩ කරන්නට සිදුවූ බවත් නදී කියන්නීය.

**"එක වෙලාවක් කොකිස් දහදහක ඕඩර් එකක් ආවා. තවත් වෙලාවක අතිරස දහදහක ඕඩර් එකක් ආවා. ඉතින් ඒ වගේ ඉල්ලුම අනුව මගේ ඥාතීන් ඇතුළු අසල්වාසීන් කිහිපදෙනෙක් ඒ කටයුතුවලට සහාය දෙමින් වැඩ කරනවා. ඒ වගේම දුවලා දෙන්නත් ඉස්කෝලේ ඇරුණු ගමන් දුවගෙන එන්නේ මේ වැඩවලට උදව් වෙන්න. ඒ දෙන්නට මං කොණ්ඩ කැවුම් හදන හැටිත් ඉගැන්නුවා. ඒ වගේම එයාලා අනෙක් හැම කෑම වර්ගයක්ම හදන හැටි දන්නවා. මට ගෙදර උයන පිහන වැඩවලටත් උදව් වෙනවා. පොඩි දුව නම් ලොකු වුණහම හොඳ වෙෆ් කෙනෙක් වෙන්න කැමතියි කියලා කියනවා."**

හරිනිත් හසදිත් ඉපදෙන්නේ මිනිත්තුවක දෙකක වෙනසකිනි. ඔවුන් පාසල් යන්නේත්, ගෙදර වැඩවලට අම්මාට උදව් වෙන්නේත් එකටම ඇලී ගැලී හිඳිමිනි. දස හැවිරිදි මේ පැංචියන් දෙදෙනා ඉගෙනුම ලබන්නේ ඉඹුල්ගොඩ සුනේත්‍රාදේවි ප්‍රාථමික විද්‍යාලයේ පහවසර පන්තියේයි. ඉගෙනුමටද දෙදෙනා එක වාගේ දක්ෂය. පාඩම් කරන්නට වාගේම රසකැවිලි පැකට් කරන්නට තිබුණාහොත් රෑ නිදි මරාගෙන වුව තාත්තාට උදව් කරන්නට මේ දූවරුන් දෙදෙනා බොහෝ කැමතිය.

**"මම ආච්චි අම්මා කැවිලි පෙවිලි හදනවා දැකලා ඒ ගැන හුරුවක් ලැබුවා. හැබැයි දැන් මම කැවිලි පෙවිලි හදන්නේ මගේම හුරුවට. පදම හරිද වැරදිද කියලා ඇහේ හුරුවට කියන්නත් පුළුවන්. ඒ වගේම රසකැවිලි හදන්නෙත් හාල් ගෙදරම සෝදලා, වේලලා, කොටලයි. මුංඇට වුණත් එහෙමයි. පැණි ගේන්නේ හලාවතින්. මේ සියලු ද්‍රව්‍ය හොඳ තත්ත්වයෙන් යෙදුවම රසකැවිල්ලේ රසයත් උපරිමයි."**

අලුවා, පොල් ටොෆී, රුලං ටොෆී, පැණි වළලු, හැඳි කැවුම්, කොණ්ඩ කැවුම්, කළු දොදොල්, මුං කැවුම්, කොකිස් මෙන්ම නැවුම් එළකිරි යොදා හදන කිරි ටොෆී වර්ගයක්ද තිබේ. මේ සියල්ල අවුරුදු කැවිලි මේසය රසගැන්විය හැකි අපූර්ව රස එකතුවකි.

**"මේ හැම කටයුත්තක්ම සාර්ථක කරගන්න මුල ඉඳලම උදව් කරපු පිරිසක් ඉන්නවා. ඒ හැමදෙනාටම ස්තුතියි. ඒ වගේම දිනපතා ලංකාදීප කර්තෘ සිරි රණසිංහ මහතාත් විශේෂයි. අපේ නෑදෑයෝ, අසල්වැසියෝ ඒ හැමදෙනාටමත් ස්තුතියි."**

නදී කියන්නීය.

අපේකම, ගමේකම සමඟින් අවුරුදු සිරියාව සිත්සේ විඳින්නට ඔවුන් ඔබට සුභාශිංසන ගෙනෙද්දී **'ධරණී'** අපද ප්‍රාර්ථනා කරන්නේ සොම්නසින් පිරි සතුට සාමය රජවන සෞභාග්‍යමත් සිංහල හින්දු අලුත් අවුරුද්දක් වේවා යනුවෙනි.

දීපා වසන්ති එදිරිසිංහ
ඡායාරූප - සමන් අබේසිරිවර්ධන


HONDA
PRORIDE
SAFETY-SRI LANKA
Stafford
Motor Co. (Pvt) Ltd.
එක් දින පාඨමාලා
ගාස්තුව- රු. 5000/=
ප්‍රෝරයිඩ් සේෆ්ටි රයිඩින් ඇකඩමි
මගින් රියදුරු බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින ඔබ වෙනුවෙන්ම සුවිශේෂී යතුරුපැදි පුහුණු සැසි..
• අපගේ යතුරුපැදි පුහුණු පාඨමාලාව සඳහා අලුතෙන් යතුරුපැදි භාවිතා කරන්නන්, යතුරුපැදි ආශ්‍රිතව රැකියාවල නිරතවන්නන්, රියදුරු බලපත්‍රය ගැනීමට අපේක්ෂාවෙන් සිටින්නන් සඳහා සහභාගී විය හැක.
• සෑම මූලික පාඨමාලාවක් සඳහාම න්‍යායාත්මක අභ්‍යාස හා ප්‍රායෝගික අභ්‍යාස ඇතුලත් වේ.
• පාඨමාලාව තුල ධාවන ඉරියව්ව, ධාවන සමබරතාවය, යතුරුපැදි තිරිංග භාවිතය හා ආරක්ෂාකාරී හැරවීම් ඇතුලු ධාවන කරුනු රැසක් ආවරණය කෙරේ.
• යතුරුපැදි රියදුරු බලපත්‍ර ප්‍රායෝගික පරීක්ෂණය වෙනුවෙන් පෙර පුහුණුවක් අවැසි ඔබ වෙනුවෙන් විශේෂයි.
ප්‍රෝරයිඩ් සේෆ්ටි රයිඩින් ඇකඩමි,
නො.262, තලවතුගොඩ පාර,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ
විමසීම්:
077 358 4050 (නාමල්)
076 895 0870 (චතුරංග)
බලගැන්වීම
සී/ස ස්ටැෆර්ඩ් මෝටර් (පුද්.) සමාගම.


Ruveda™
හර්බල් බියුටි ක්‍රීම්
සැමදා දිදුලන සමකට
ශ්‍රී ලාංකික සම සඳහා විශේෂයෙන් සකසා ඇත
සම හිරු රශ්මියෙන් සහ දූවිලි වලින් ආරක්ෂා කරයි
සම දුර්වර්ණ වීම සහ රැලි වැටීම වළකයි
පැහැපත් සමක් ලබාදෙයි
ප්‍රත්‍යක්ෂ ශාඛ ඖෂධ රැසක සංයෝගයකි
Ruveda
රසදිය, බ්ලීච් හා අහිතකර රසායනයන්ගෙන් තොරයි.

# ‘අ’ යන්න අවුල් නම්

## අමිතාබ් බච්චන්ටත් වැඩ වරදින්න එපැයි

**දවසක් මම බබෙක්ට ‘න’ යන්නෙන් නමක් දැම්මා. දරුවගේ ජීවිතේ සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙන විදිහට තමයි නම තිබ්බේ. මේ දෙමව්පියන්ගේ වැඩිහිටියෝ මේ නම ගැන ජ්‍යෝතිෂ්‍ය මහත්මයෙක්ට කියලා. නමේ මුල් අකුර අපාය අක්ෂරයක් නිසා මේ නම දරුවට බොහොම අසුබයි කියලා ඒ මහත්මයා කියලා. ඉතින් මේ උදවිය කලබල වෙලා නැවතත් මගේ ළඟට ආවා. මේ දරුවගේ අම්මගේ නම බලද්දි මීට කලින් ඇයගේ සහොදරියක් අන්ත්‍රා වෙලා තියෙන බව මට පෙනුණා. ඉතින් නම විතරක් බලලා මම ඒ දේවල් ඔවුන්ට කිව්වා. අර ජ්‍යෝතිෂ්‍ය මහත්මයාට මේ අම්මගේ හඳහන දීලා මේ විස්තර අහන්න කියලත් මම කිව්වා. හැබැයි එතැනදි ඔහු හරි විස්තරයක් කියන්න සමත් වෙලා නැහැ**



තමන්ගේ ලෙයින් මසින් උපදින දරුවන්ට හොඳම දේ දෙන්න අම්මලා, තාත්තලා නොකරන දෙයක් නැහැනේ. ඉතින් මව්පියන්ගෙන් දරුවෙක්ට ලැබෙන පළවෙනිම දේ තමයි ඔහුගේ/ඇයගේ නම.

හැබැයි ගොඩක් අය දරුවට නමක් තියද්දි බලන්නේ සුබ අකුරක්, ලස්සන අර්ථයක් සහ උච්චාරණයේ පහසුව කියන ටික විතරයි. ඔය අතරේ තමන් කැමතිම නළුවගේ නැත්තම් නිළියගේ නම දරුවට තියන අයත් නැතුවම නෙවෙයි.

නාම ශාස්ත්‍රයට අනුව නමක් කියන්නේ කෙනෙක්ගේ අනන්‍යතාවය විතරක් නෙමෙයි ජීවිතේ දිශානතිය තීරණය කරන සුක්කානම. එහෙම බැලුවම මේ කියන සුක්කානම තියෙන්නේ දරුවගේ වැඩිහිටියන්ගේ අතේ. හැබැයි ඒ ගැන අවබෝධයක් නැතිව ආවට ගියාට නම් තැබීම නිසා ලංකාවේ බහුතරයකගේ නම් දෝෂ සහිතයි කියලා කිව්වේ නාම හා ශබ්ද ශාස්ත්‍රඥ නිවංක දිනාරංග.

**“ගොඩක් අය කරන්නේ දරුවා ඉපදුණු හැටියේ තමන් දන්න කියන ජ්‍යෝතිර්වේදියෙක්ට දරුවගේ උපන් වෙලාව ගිහින් දෙන එක. එතකොට ඔවුන් දරුවගේ ලග්නය, නැකැත, දවස එහෙම බලලා සුබ අක්ෂර ටිකක් ලියලා දෙනවා. ජ්‍යෝතිර්වේදයට අනුව භාෂාවේ තියෙන අක්ෂර අපාය අක්ෂර සහ දේවාක්ෂර කියලා කොටස් දෙකකට වෙන් කරනවා. අ, ර, ණ, න වගේ අක්ෂර අපාය අක්ෂර විදිහටත් ස, ත, ද, ව, ට වගේ අක්ෂර දේවාක්ෂර විදිහටත් හඳුන්වනවා.**

**දරුවෙක්ට නම් තියද්දි කිසිම වෙලාවක මේ අපාය අක්ෂර යොදාගන්න එපා කියලා කියනවා. ඒ නිසා ජ්‍යෝතිර්වේදීන් ඔය කියන අක්ෂර ලබාදෙන්නෙත් නැහැ. ඔවුන් දෙන්නේ දේවාක්ෂර විතරයි.**

**ඊටපස්සේ අම්මලා තාත්තලා ඔය දෙන අකුරට නමක් හදාගන්නවා. අන්තර්ජාලයෙන් හොයලා නම් දාන අයත් ඉන්නවා. උපන් දිනය, වෙලාව ඇතුළත් කළාම දරුවන්ට නම් ලබාදෙන දුරකතන යෙදවුම් පවා දැන් තියෙනවානේ.**

**සුබ අක්ෂර විතරක් බලලා ඔහොම අහම්බෙන් තියන නම් සියයට අනූවකම දෝෂ තියෙනවා. ගල් සීයක් ගහද්දි එකක් වදිනවා වගේ බොහෝම කලාතුරකින් හම්බෙන සුබ නමුත් නැතුවම නෙමෙයි.**

**ඔහොම ඕනවට එපාවට නම් තියලා දෝෂ ඇති වුණාම ඉතින් ඒ දරුවන්ට පුංචි කාලේ ඉඳලම ප්‍රශ්න ගැටලු ඉවරයක් නෑ. කොහෙන් හරි හොයාගන්න සුබ අකුරුවලින් හිතුමතේට දරුවන්ට නම් දාලා විවිධ ප්‍රශ්නවලට මුහුණදෙන එහෙම අම්මලා තාත්තලා දවස ගානේ මට හම්බෙනවා.**

**නාමකරණ ශාස්ත්‍රයට අනුව නම් මේ ලෝකේ කිසිම අක්ෂරක් සුබයි අසුබයි කියලා වෙන් කරන්න බැහැ. අකුර යෙදෙන තැන, ඝන පිහිටීම් එතකොට නමේ අනිකුත් කොටස් සහ වාසගම එක්ක එකතු වුණාම හැදෙන සංඛ්‍යාතය අනුව තමයි නමක සුබ අසුබතාවය තීරණය වෙන්නේ. අපාය අක්ෂරවලින් නම් පටන් ගත්තත් ලෝක ප්‍රකට වුණු පුද්ගලයෝ කොච්චර ඉන්නවද? උදාහරණයක් විදිහට අක්ෂේ කුමාර්, අමිතාබ් බච්චන් ඔය ඕන හැටියේ ඉන්නේ.”**

මේ අපාය අක්ෂර සහ දේවාක්ෂර තේරිල්ල සමාජයේ ගොඩක් අයගේ ඔලුවල පැලපදියම් වෙලා තියෙන දෙයක්ලු. ඒකට හොඳ උදාහරණයකුත් වෛද්‍ය නිවංක කිව්වා.

**“පුංචි බබලාට නම් දාගන්න අම්මලා තාත්තලා ගොඩක් මගේ ළඟට එනවා. ක්ෂණික නූඩ්ල්ස් හදන තාලෙට අලුත උපන් දරුවෙක්ට නමක් තියන්න බැහැ. ඒකට අවම වශයෙන් දවස් තුන හතරක්වත් ගත වෙනවා.**

**දවසක් මම බබෙක්ට ‘න’ යන්නෙන් නමක් දැම්මා. දරුවගේ ජීවිතේ සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙන විදිහට තමයි නම තිබ්බේ. මේ දෙමව්පියන්ගේ වැඩිහිටියෝ මේ නම ගැන ජ්‍යෝතිෂ්‍ය මහත්මයෙක්ට කියලා. නමේ මුල් අකුර අපාය අක්ෂරයක් නිසා මේ නම දරුවට බොහොම අසුබයි කියලා ඒ මහත්මයා කියලා. ඉතින් මේ උදවිය කලබල වෙලා නැවතත් මගේ ළඟට ආවා. මේ දරුවගේ අම්මගේ නම බලද්දි මීට කලින් ඇයගේ සහොදරියක් අන්ත්‍රා වෙලා තියෙන බව මට පෙනුණා. ඉතින් නම විතරක් බලලා මම ඒ දේවල් ඔවුන්ට කිව්වා. අර ජ්‍යෝතිෂ්‍ය මහත්මයාට මේ අම්මගේ හඳහන දීලා මේ විස්තර අහන්න කියලත් මම කිව්වා.**

හැබැයි එතැනදි ඔහු හරි විස්තරයක් කියන්න සමත් වෙලා නැහැ. ඒ නිසා ඒ උදවිය එතැනදි මම කියන දේ පිළිගත්තා. ඒ වගේම ඒ දරුවා අද වෙනකොට බොහොම ක්‍රියාකාරී විදිහට අධ්‍යාපන කටයුතු කරගෙන යනවා කියලා ඒ දෙමව්පියෝ මේ මෑතකදිත් මට ඇවිත් කිව්වා.

**අකුරු ගැන විතරක් හිතලා දාන්නන්වාලේ දරුවන්ට නම් දාන්න එපා කියන එක තමා මට කියන්න ඕනේ. මොකද සමහරු එනවා නමේ දෝෂ නිසා ජීවිතේ හොඳම කාලේ නරක විදිහට ගෙවලා**

අකුරු ගැන විතරක් හිතලා දාන්නන්වාලේ දරුවන්ට නම් දාන්න එපා කියන එක තමා මට කියන්න ඕනේ. මොකද සමහරු එනවා නමේ දෝෂ නිසා ජීවිතේ හොඳම කාලේ නරක විදිහට ගෙවලා. පස්සේ ඒ දෝෂ හදන්න පුළුවන් වුණත් ඒ ගෙවුණු කාලය ආයෙත් ගන්න බැහැනේ. ඉතින් හොඳම දේ තමයි අලුත උපන් බිළිඳාට මේ සියලු කරුණු කාරණා සලකා බලලා නමක් තියන එක. එතකොට ඒ ජීවිතේ මුල ඉඳලම සාර්ථක කරගන්න පහසුයි.”



නාම හා ශබ්ද ශාස්ත්‍රඥ
නිවංක දිනාරංග රත්නායක

නදීශා නිර්මාණී





ගල්කිස්ස මහ හෝටලයේ ආහාර හා ප්‍රවර්ධක අධ්‍යක්ෂ
**ආචාර්ය පබ්ලිස් සිල්වා** ඉදිරිපත් කරයි

සම්බන්ධීකරණය
ගල්කිස්ස මහ හෝටලයේ **නිමාකෝ ද සිල්වා**

# අවුරුදු මේසෙට කැවිලි ජාති අටක්



වට්ටක්කා අලුවා
හදන හැටි බලන්න
මෙම **QR**
කෝඩ් එක
ස්කෑන් කරන්න

## වට්ටක්කා අලුවා

### අවශ්‍ය ද්‍රව්‍ය

- වට්ටක්කා (සුද්දකර සිහින්ව ග්‍රේට් කරගත්) 500g
- එළකිරි 500ml
- සීනි 750g
- එළඟි තෙල් මේස හැඳි 2
- කජු 50g
- කරඳමුංගු තේ හැඳි 3/4
- ලුණු තේ හැඳි 1/2

### සාදන ක්‍රමය

- වට්ටක්කා, ලුණු සහ එළකිරි එකට දමා උයාගන්න. බාගෙට සිඳීගෙන එන විට සීනි, කජු හා කරඳමුංගු එකතු කරන්න.
- භාජනයේ පතුලේ නොඇලෙන පරිදි හැඳිගාමින් තරමක් ඝනවීගෙන එනවිට එළඟිතෙල් මිශ්‍ර කරන්න.
- ඉන්පසු තැටියකට දමා තුනී කර නිවුණු පසු කැබලි කපාගන්න.

## පොල් ඇට්ටි

### අවශ්‍ය ද්‍රව්‍ය

- හාල්පිටි (බැදගත්) 250g
- සිහින්ව ගාගත් පොල් 150g
- සූරාගත් හකුරු 100g
- පොල්පැණි අඩුකෝප්ප 1/2
- ලුණු තේ හැඳි 1/4

### සාදන ක්‍රමය

- හාල්පිටි, පොල්, හකුරු සහ ලුණු එකතුකර අතේ නොඇලෙන ලෙස අනාගන්න. (අවශ්‍යනම් පැණි ස්වල්පයක්ද එක්කර ගන්න.)
- මිශ්‍රණයෙන් දෙහි ගෙඩියක ප්‍රමාණයේ බෝල සාදගන්න.
- සාදගත් බෝලය ඇඟිලි 3ක් උපයෝගී කරගෙන තද කරන්න.
- මෙය හුමාලයෙන් තම්බාගන්න.
- පිළිගැන්වීමේදී සිදුරු 3න් උඩට පැණි වක්කරන්න.





ලොන්ඩපතුරු හදන හැටි බලන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

# ලොන්ඩපතුරු

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| තිරිඟු පිටි | 500g |
| බිත්තර | 1 |
| බේකින් පවුඩර් තේ හැඳි | 1 |
| සීනි | 300g |
| එළඟි තෙල් | 200g |
| පිටි | 50g |
| ලුණු තේ හැඳි | 1/4 |
| තෙල් 1L | |

## සාදන ක්‍රමය

- පිටි, බිත්තර, බේකින් පවුඩර් සහ ලුණු එකට දමා වතුර එකතු කරමින් පැටිස් පේස්ට්‍රිය මෙන් අනා පැයක් පමණ තබන්න.
- ඉන්පසු හොඳින් තුනී කරගන්න.
- එළඟි තෙල් සමඟ පිටි 50g හොඳින් කලවම් කරගන්න.
- තුනී කළ මිශ්‍රණය මත එළඟි තෙල් ගාගන්න.
- ඉන්පසු මෙය රෝල් කරගන්න.
- එම රෝලය කුට්ටි මෙන් වෙන්කර කපාගන්න.
- කපාගත් කැබලි දිග අතට රෝල් කරගන්න.
- ගැඹුරු තෙලේ බැදගන්න.
- සීනි පත්පැණි කර බැදගත් කැබලිවලට උඩින් දමාගන්න.

# මඤ්ඤොක්කා පොතුසීනි දැවටුම

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| මඤ්ඤොක්කා පොතු | 300g |
| සීනි | 200g |
| වතුර අඩුකෝප්ප | 1/4 |
| තෙල් | 1/2L |

## සාදන ක්‍රමය

- මඤ්ඤොක්කා සුද්දකර පොතු සිහින්ව කපාගන්න.
- වතුර ටිකක් ලිප තබා උතුරනවිට මඤ්ඤොක්කා පොතු දමා විනාඩියක් පමණ තබා වතුර පෙරා, සෝදා, වේලාගන්න.
- තෙල් ලිප තබා වේලාගත් මඤ්ඤෙක්කා පොතු ගැඹුරු තෙලේ බැදගන්න.
- භාජනයක් ලිප තබා සීනි එක්කර වතුර දමා ලිප තබා සීනි පත්පැණි කර, බැදගත් මඤ්ඤෙක්කා පොතු දමා මිශ්‍ර කරගන්න. (එකට එක නොඇලෙන පරිදි)





# දකුණේ අග්ගලා

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| බැදගත් හාල්පිටි | 1200g |
| සීනි | 750g |
| වතුර | 600ml |
| කපාගත් කජු | 100g |
| කැබලි ගම්මිරිස් තේ හැඳි | 1 |
| ලුණු තේ හැඳි | 1/4 |

## සාදන ක්‍රමය

- හාල්පිටි 200gක් අයින් කරගන්න.
- සීනි හා වතුර භාජනයකට දමා ලිප තබා උතුරනවිට ලිප නිවාගන්න.
- පිටිවලට ගම්මිරිස්, කජු සහ ලුණු එක්කර, සීනි මිශ්‍රණය ටික ටික එක්කරමින් අතේ නොඇලෙන පදමට සාදගන්න.
- දෙහි ගෙඩියක ප්‍රමාණයේ බෝල සාද අයින් කරගත් පිටිවල තවරාගන්න.

# මස්කට්

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| තිරිඟු පිටි | 500g |
| සීනි | 2Kg |
| දුන්තෙල් | 200g |
| කජු | 100g |
| රෝසවතුර | 5ml |
| බිත්තර සුදුමද | 2 |
| වතුර | 2L |
| දෙහි යුෂ තේ හැඳි | 1 |

## සාදන ක්‍රමය

- දුහුල් මල්පීස් රෙදි කැබැල්ලක් ගෙන පාන් පිටි දමා පොට්ටනියක් බැඳගන්න.
- පිරිසිදු වතුර භාජනයක් ගෙන පිටි පොට්ටනිය වතුරේ දමාගෙන පොට්ටනියේ ඇති පිටි ටික ටික මිරිකමින් භාජනයකට සෝද හරින්න.
- සියල්ල භාජනයට සෝද ඇරිය පසු පොට්ටනියේ ඉතුරුවෙන ලාටු මෙන් කොටස ඉවත්කර ගන්න.
- අඩිය ඝනකම් භාජනයක් ගෙන බිත්තර සුදුමද සහ දෙහි යුෂ දමා හොඳින් ගසන්න.
- ඉන්පසු එයට සීනී සහ වතුර ලීටර් 2 දමා දියකර ලිප තබා උතුරන විට ගින්දර අඩුකර ගන්න.
- උඩට එන පෙණ සහ අපවිත්‍ර ද්‍රව්‍ය ඉවත්කර ගන්න. ඉන්පසු පිටි ටික ටික එකතුකර ගන්න.
- ලී පත්තක ආධාරයෙන් අඩු ගින්දරින් දෙදෙල් මෙන් අඩිය නොඇල්ලන ලෙස හැඳිගාගන්න.
- මෙය ගුලියක් සේ ආවිට දුන්තෙල් ටික ටික එකතුකරමින් හැඳිගාගන්න.
- ඔබ කැමති ස්වාභාවික වර්ණයක් යොදගන්න.
- දුන්තෙල් සියල්ල දමා කලවම් වූවාට පසු රෝස වතුර සහ කජු එක්කර ගන්න.
- මෙය තැටියකට දමා තුනී කර දින දෙකකට පසු කෑලි කපාගන්න.





# මුරුක්කු

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| කඩල පිටි (කබලේ බැදගත්) | 200g |
| බැදගත් හාල්පිටි | 100g |
| බටර් මේස හැඳි | 2 |
| සූදුරු තේ හැඳි | 1 |
| කොත්තමල්ලි කුඩු තේ හැඳි | 1 |
| මිරිස් කුඩු මේස හැඳි | 1 |
| ලුණු තේ හැඳි | 1 |
| පොල්කිරි අඬුකෝප්ප | 1 |
| තෙල් | 1L |

## සාදන ක්‍රමය

- උණුකරගත් පොල් කිරි සමඟ ඉතිරි සියල්ල එකට අනා ඉඳිආප්ප මිශ්‍රණයක් සේ සාදගන්න.
- ඉන්පසු තෙල් ලිප තබා මුරුක්කු වශයෙන් තෙලට මෙම මිශ්‍රණය වක්කරගන්න.
- බැදුනු පසු තෙලෙන් ඉවත් කර තෙල් බේරෙන්න තබා කුඩා කැබලිවලට කඩාගන්න.

# බත් ලඩ්ඩු

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| වේලාගත් බත් | 200g |
| සීනි | 200g |
| ගම්මිරිස් තේ හැඳි | 1/2 |
| ගාගත් පොල් | 100g |
| ලුණු තේ හැඳි | 1/4 |

## සාදන ක්‍රමය

- වේලාගත් බත් කබලේ බැදගන්න.
- සියල්ල එකට මිශ්‍රකර කොටාගෙන ගුලි සාදගන්න.



# ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න



# කිරණ
## මාසික අධ්‍යාපනික පුවත්පත්
## අප්‍රේල් කලාපයන් දැන් වෙළෙඳපොළේ
## 5 කිරණ පත්තරෙන් ශිෂ්‍යත්වයට ඉලක්ක ප්‍රශ්න පත්තර හතරක්...



### අරුණින් උදාවූ කිරණ

පුංචි දරුවන්ගේ දැනුම පරාසය පුළුල් කිරීම සඳහා “කිරණ” පුවත්පත දරුවන් අතට පත් කිරීම සම්බන්ධව සතුටුවෙමි. විෂයනුබද්ධ මෙන්ම විෂයබාහිර දැනුම, නවීන තාක්ෂණය ද මුසු කරමින් කියවීමට මෙන්ම සවන්දීමට ද හැකි පුවත්පතක් දරුවන් අතට පත්විම දරුවන්ට මෙන්ම දෙමාපියන්ට ද නව අත්දැකීමක් වනු ඇත. පුළුල් අත්දැකීම සහිත ප්‍රවීන ඇදුරු මඩුල්ලක් සමගින් දැයේ දරුවන්ගේ දැනුම් නිම්වළලු පුළුල් කිරීමට “කිරණ” දරන උත්සාහය සාර්ථක වේවායි පතමි.

**උදය වික්‍රමසිංහ**
විදුහල්පති
මාර/වෙහෙරගම්පිට
ඕල්කට් ආදර්ශ විදුහල, මාතර



වසර පහකින් සමන්විත ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අවධි තුනේ ම අවශ්‍යතා මැනැවින් අවබෝධ කර ගනිමින් “කිරණ” 3,4,5 ශ්‍රේණි සඳහා වෙන වෙන ම දරුවන්ට මග කියාදීමට ගත් වෑයම මහත් සේ අගයමි. එසේ ම ගුරු සේවයේ හසල අත්දැකීම් ඇති ලේඛක මඬුල්ලකගේ සහාය ලබා ගනිමින් දැනුම, ආකල්ප, කුසලතා සහ නිර්මාණශීලී චින්තනයට ද රසවින්දනයට ද දරුවා යොමු කිරීම “කිරණ” පුවත්පත් ත්‍රිත්වයේ විශේෂත්වයකි.
අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි දරු පරපුරක් තැනීමට “කිරණ” පුවත්පත යාත්‍රාවක් වනු ඇත.

**පියතිස්ස රන්දෙනිගල,**
විදුහල්පති,
මාබිම විද්‍යාකර ප්‍රාථමික විද්‍යාලය,
මාකෙවිට



“කිරණ” ශිෂ්‍යත්ව පුවත්පත් අතර නව පෙරළිකාර පුවත්පතක් ලෙස සඳහන් කළ හැකි ය. එමෙන් ම ශිෂ්‍යත්ව විභාගයට අවශ්‍ය සියලුම විෂය කරුණු ආවරණය වන සේ කිරණ පුවත්පත නිර්මාණය කර තිබීම කාලෝචිත ක්‍රියාවකි. විශේෂයෙන් ම අත්දැකිම් බහුල සුදුසුකම් ලත් ගුරු මණ්ඩලයක් ලේඛක මණ්ඩලයට යොදා ගෙන තිබීම පැසසුම් සහගත ය.

දරුවන්ගේ දැනුම, සතුට, හැකියාව දියුණු කරන පුවත්පතක් ලෙස “කිරණ” පුවත්පත හැඳින්විය හැකි ය. එම නිසා ලංකාවේ ගුරුවරුන් දෙමාපියන් හා දරුවන් අතරේ කෙටි කාලයක් තුළ “කිරණ” අධ්‍යාපනික සඟරාව ව්‍යාප්ත වී ඇති බව දැකීම සතුටට කාරණයකි.

**සමිතා ද සිල්වා**
විදුහල්පතිනි
බප/මීග/ගොන්සාලෙස් මහා විදුහල, පමුණුගම, ජාඇල



## දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් දැන් මිලදී ගත හැක




අප්‍රේල් 23 වැනිදා සිට
සෑම සෙනසුරාදාවකම
පෙරවරු 8.00 සිට 12.00 දක්වා

කිරණ
ශිෂ්‍යත්ව පුවත්පත හා සමගාමීව පැවැත්වෙන

fm දෙරණ ශිෂ්‍යත්වය හුරු ලේසියි

පාඩම් මාලාව
සෑම සතියේ දිනකම
පෙරවරු 6.00 සිට 7.00 දක්වා



# පුතාගේ ලිංගික හැසිරීම්වලින් සතුටක් නැති බව ලේලි නැන්දම්මට කියලා

**“බඳින්න කලින් අපි මාස තුනක් යාළුවෙලා හිටියා. ඒ කාලේ එයාගේ පුදුම හොඳක් තිබුණේ. ඒ තරම් හොඳ කෙනෙක් මට නැතිවෙයි කියන බයටමයි මම එයාව ඉක්මනටම කසාද බැන්දේ. ඒත් දැන් එයා හරිම වෙනස් මිස්.”**

ඊයේ පෙරේද දවසක උපදේශනයට ආව එක සැමියෙක් එහෙම කියද්දී **‘සිනා සිසී කිව්වත් පැණි පෙරෙන කතා - මිනිසා තමයි හඳුනාගත නොහැකි සතා’** කියන පරණ කවිය ඉබේටම වගේ මට මතක් වුණා.

මේ සැමියට තිබුණේ ගොඩක් දෙනෙක් ආදර සබඳතා ඇතුළේ සහ විවාහ ජීවිත ඇතුළේ මුහුණ දෙන ගැටලුවක්. ඔහුගේ කතාව අද මාතෘකාවට ගන්න හිතුවේ ඒකයි. කතාව කියන්න ලේසියටත් එක්ක මම ඔහුව නඳුන් කියලා හඳුන්වන්නම්.

ඒ වෙනකොට නඳුන් විවාහ වෙලා හරියටම අවුරුද්දයි. බඳින්න කලින් අර කිව්වත් වගේ මේ බිරිඳ ඔහු ගැන සෑහෙන හොයලා බැලුවලු. නිතරම කෑමබීම පවා උයාගෙන ගෙනැල්ලා දෙනවලු. ඔන්න ප්‍රශ්නේ ඇතිවෙලා තියෙන්නේ විවාහය දවසේ.

විවාහය දවසේ මේ බිරිඳ තමන්ගේ පැත්තෙන් විවාහයට ආපු ඥාති හිතමිතුරන්ට වැඩි තැනක් දීලා. මේ සැමියගේ නෑයන්ව ගාණකටවත් අරගෙන නැහැ. මේ ප්‍රශ්නේ නිසාම මඟුල දවසෙම නඳුන්ගේ අම්මා එක්කත් මේ බිරිඳ ගැටලුවක් ඇති කරගෙන. විවාහයෙන් පස්සේ මේ දෙන්නා වෙනම පදිංචි වෙලා. එතැන ඉඳලා තමන් ජීවත් වුණේ අපායක කියලා තමයි නඳුන් මට කිව්වේ. මේ බිරිඳ නඳුන්ට කතා කරන්නේ බොහොම සැරපරුෂ විදිහටලු. ඒ වගේම ඇයට නිතරම තරහා යනවලු.

**“තරහා ගියාම යකෙක් ආවේශ වෙලා වගේ ගෙදර බඩු මුට්ටු පවා පොළවෙ ගහනවා.”**

බිරිඳගේ පුදුමාකාර කේන්තිය ගැන නඳුන් පැහැදිලි කළේ එහෙමයි.

ඒ වගේම බිරිඳගේ හැම වැඩක්ම කරලා දීලා තියෙන්නේ නඳුන්. ඇගේ වැඩ කරගන්න අවශ්‍ය තැන්වලදී බොහොම යාප්පුවෙන් ඒ දේවල් කරගන්නත් ඇය කටයුතු කරලා තියෙනවා.

ඒ විතරක් නෙමෙයි බිරිඳ නිතරම තමන්ව පහත් කරලා කතා කරනවා කියලත් ඔහු කිව්වා. සැමියගේ ලිංගික හැසිරීම් ගැන ඇය තෘප්තිමත් නැති බවත් ඒ ගැන ඔහුගේ මවට කියනවා කියලත් නඳුන්ව නිතරම වගේ බය කරලා.

මේ කිව්ව කාරණාවලට අමතරව නඳුන් ඔහුගේ බිරිඳගේ වැරදි ගොඩක් මාත් එක්ක විස්තර කළා. නඳුන් හිටියේ මහ විශාල පීඩනයක බව ඔහුගේ ඒ කතාබහෙන්ම මට තේරුණා.

ඔහු මගේ ළඟට ඇවිල්ලා තිබුණේ විවාහය නිසා ඇතිවෙච්ච පීඩනයට උපදේශනයක් ගන්න මිසක් විවාහ උපදේශනයක් ගන්න නෙමෙයි. බිරිඳව වෙනස් කරන්න බැහැ කියන එක තමයි නඳුන්ගේ මතය වුණේ.

ඔය කිව් කරුණු කාරණා සලකලා බලද්දි නඳුන් ඉන්නේ විෂ සහිත විවාහයක (Toxic Marriage) කියන එක මට තේරුණා. ඉතින් ඒ වගේ දේකදි පීඩනයට ලක්වෙන සහකරුවට විතරක් උපදේශනය දෙන එක ගඟට ඉනි කපනවා වගේ වැඩක්. ඒ නිසා මොන උප්පරවැට්ටිය දලා හරි බිරිඳව මගේ ළඟට එක්කරගෙන එන්න කියලා මම කිව්වා.

**මනෝ වෘත්තිකයන් විදියට අපි නම් උපදෙස් දෙන්නෙ මෙවැනි පුද්ගලයන් සමඟ සබඳතා නතර කර දමන්න කියලා. නමුත් විවාහ වුණු කෙනෙකුට නම් එහෙම බැරි නිසා උත්සාහ කරලා බලන්න වෙනවා**

මනෝ විද්‍යාවේදී අපි විෂ සහිත මිනිසුන් (Toxic People) කොට්ඨාසයක් ගැන කතා කරනවා. මේ කියන අයගේ අපි දකින පොදු ලක්ෂණ කීපයක්ම තියෙනවා.

පළමුවැන්න මේ අය තමන්ගේ සහකරුවා සතුටින් ඉන්නවට වඩා දුකින් ඉන්නවා දකින්න කැමතියි. ඉතින් ඒ නිසා සහකරුවාව විවේචනය කරන්න, මානසිකව වට්ටන්න නිතරම වගේ ඔවුන් එක එක ප්‍රයෝග ක්‍රියාත්මක කරනවා. අවිශ්වාසය වගේම ඊර්ෂ්‍යාවත් ඔවුන් තුළ තියෙනවා. ඒ විතරක් නෙමේ සහකරුවා නිතරම වගේ මේ විෂ සහිත පුද්ගලයාට අවධානය දෙන්න ඕනේ. නැත්නම් විනාශයි. තමන්ගේ සහකරුවා මත යැපෙන එක විෂ සහිත අයගේ තව ලක්ෂණයක්. මේ අයට ද්විත්ව චරිත රඟපාන්නත් පුළුවන්. වෙලාවකට බොහොම හොඳයි. ඒ වගේම වෙලාවකට බොහොම ප්‍රචණ්ඩයි. නපුරුයි.

සාමාන්‍යයෙන් මේ අය සබඳතා ඇති කරගන්නේ ආත්ම අභිමානය තරමක් අඩු අය එක්ක. මොකද එයාලව පාලනය කරන්න පහසුයි කියන එක ඔවුන් දන්නවා.

ආදර සබඳතාවකදී නැත්නම් විවාහ ජීවිතයකදී අපි බලාපොරොත්තු වෙන්නේ ජීවිතයට සහකරුවෙක්. ඒ සහකරුවා එක්ක එකතු වෙලා ගෙවන ජීවිතය ආදරණීය, සැනසිලිදායක, සෞඛ්‍යසම්පන්න සබඳතාවයක් වෙන්න ඕනේ. ඒත් විෂ සහිත පුද්ගලයෙක් එක්ක ඉන්න කෙනෙක්ට ඒ සම්බන්ධතාවයෙන් උරුම වෙන්නේ බය, සැකය, කාංසාව, විශාදය, මානසික අවපීඩනය, අසරණකම, අනාරක්ෂිතතාව වගේ දේවල්. මොකද මේ පුද්ගලයා ඊළඟට මොකක් කරයිද කියන අනපේක්ෂිත හැඟීමක් සහකරුවාට නිතරම දැනෙනවා. කොටින්ම කිව්වොත් මේ වගේ කෙනෙක් එක්ක පවුල් කන එක හරියට දැලි පිහියෙන් කිරි කනවා වගේ වැඩක්. ඉතින් මනෝ වෘත්තිකයින් විදියට අපි උපදෙස් දෙන්නේ එවැනි විෂ සහිත සබඳතාවලින් ඉවත් වෙන්න කියලයි. මොකද මේ කියන තත්ත්වය මනෝ උපදේශනය මගින් වුණත් යටපත් කරන්න අපහසු වෙන අවස්ථා තියෙනවා. හැබැයි ඉතින් විවාහ වුණාට පසසේ එහෙම ආවට ගියාට විවාහය අතඅරින්නත් බෑනේ. ඒ නිසා උත්සාහ කරන එක වැදගත්. මනෝ උපදේශනය අසාර්ථක වුණොත් නඳුන්ගේ බිරිඳව මනෝප්‍රතිකාර වෙත යොමු කරනවා කියන අදහසෙයි මම හිටියේ. ඉතින් කිව්වා වගේම නඳුන් දවසක් ඔහුගේ බිරිඳව මගේ ළඟට එක්කරගෙන ආවා.


**මේ අය තමන්ගේ සහකරුවා සතුටින් ඉන්නවට වඩා දුකින් ඉන්නවා දකින්න කැමතියි. ඉතින් ඒ නිසා සහකරුවාව විවේචනය කරන්න, මානසිකව වට්ටන්න නිතරම වගේ ඔවුන් එක එක ප්‍රයෝග ක්‍රියාත්මක කරනවා**

සම්පූර්ණ කතාව අහන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

මේ බිරිඳ මාත් එක්ක නම් බොහොම හෘදයාංගම විදියට කතා කළා. තනියම ටික වෙලාවක් කතා කරනකොට ඇගේ කුඩා කාලය බොහොම කටුක එකක් බව මට තේරුණා. මේ බිරිඳගේ පියත් විෂ සහිත ලක්ෂණ තිබුණු පුද්ගලයෙක්. පියා නිසා මේ බිරිඳගේ මව අකාලයේ සියදිවි හානි කරගෙන. එදා ඉඳලා ඇය හැදිලා වැඩිලා තියෙන්නේ පියාත් එක්ක.

මිනිස්සු කවුරුත් උපදිනකොටම විෂ සහිත මිනිස්සු වෙලා ඉපදෙන්නේ නැහැ. පුංචි කාලෙදි මුහුණදෙන ප්‍රශ්න, සමාජයෙන් හරි තැනක් නොලැබීම, අපයෝජනවලට ලක්වීම වගේ හේතු නිසා තමයි ඔවුන් වුණත් ඒ තැනට පත්වෙන්නේ. ඉතින් උපදේශන සැසි වාර හත අටකට පස්සේ නඳුන්ගේ බිරිඳගේ මේ කියන තත්ත්වය තරමක් දුරට යටපත් කරන්න මට පුළුවන් වුණා. ඒක ගැන මටත් හරි සතුටුයි. ඒ වගේම සතුටින්, ආදරෙන් පවුල් ජීවිතේ ගත කරන්න අවශ්‍ය උපදෙස් ටිකකුත් මේ දෙපළට මම ලබාදුන්නා.

ප්‍රේම සම්බන්ධයක් පටන්ගනිද්දී ගොඩක් අය බලන්නේ සහකරුවගේ රූපය ගැන. හරි එහෙම බලලා හරි යාළු වුණායි කියමුකෝ. යාළු වෙච්ච හැටියේ විවාහයකට නොයා සහකරුවගේ සහකාරියගේ හැසිරීම් රටා සියුම්ව නිරීක්ෂණය කරන්න පුළුවන් නම් ඔය කියන විෂ සහිත ලක්ෂණ අඳුනගන්න අමාරු නැහැ. එහෙම ගැටලු තියෙන බව තේරෙනවා නම් ඉක්මනින්ම ඔහුව හෝ ඇයව මනෝ උපදේශනයකට යොමු කරන්න.  ඒ කරලත් ඒ ගති යටපත් කරන්න බැහැ කියලා දැනෙනවා නම් හොඳම දේ ඒ සබඳතාවයෙන් ඈත්වෙන එක. ඒ මුකුත්ම නොකර බැන්දට පස්සේ මේ අයගේ මේ ගති ඉබේම යටපත් වෙයි කියලා හිතන එක නම් දවල්ට තරු පායනකල් බලන් ඉන්නවා වගේ වැඩක් කියලයි කියන්න තියෙන්නේ.



**මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා**
**රත්නා පුෂ්ප කුමාරි**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# අලුත බැඳපු අය අවුරුද්දට මහගෙදර දුවන්න කලින් මේ ගැනත් හිතන්න



ගියවර අලුත් අවුරුද්ද සැමරූ හැටි මතක් වෙද්දී රවීනාගේ දෙනෙත් කඳුළින් තෙත් වේ. ජීවිතයේ ගෙවුණු වසර 24ම ඇය අවුරුදු සැමරුවේ අම්මා හා තාත්තා සමඟය. පුණ්‍ය කාලය සුන්දර වූයේ ඔවුන්ගේ ආදරයත් සමඟය.

පුංචිම වයසේදී ආහාර පිසීමේ නැකත උදා වූ විට අම්මා ඇඳගෙන ඉන්නා පාටින්ම ළමා සාරියක් ඇඳගෙන අම්මා වටා කැරකුණු හැටි ඇයට තවමත් මතකය. තරුණ වියට එළඹුණු පසුව රවීනා හා අම්මා එකතුව ලිප ගිනි මොලවන්නීය. ආහාර අනුභව කරන නැකතේදී අම්මාත්, තාත්තාත් තමාට කිරිබත් කැවූ සැටිද රවීනාට සිහි වේ. අනේ ඒ කිරිබතේ රසය වැඩි කරන්නේ ඒ ආදරයය. ඒ එකමුතුකමය. ඒත් අද?

රවීනා විවාහ දිවියට එළැඹුණේ මාස කිහිපයකට පෙරය.

මේ විවාහයෙන් පසුව එළැඹෙන පළමු අවුරුද්දය. චානකගේ හිතේ මොන සැලසුම් තිබෙනවාදැයි රවීනා නොදන්නීය.

**"අනේ මට නම් බැහැ අවුරුද්දට චානකගේ මහගෙදර යන්න. එක්කෝ එයා එයාගේ ගෙදර ගියදෙන්. මම අපේ ගෙදර යනවා... ඒත් එහෙම කරන එකත් හොඳ නැහැ. ඔලුවත් විකාර වෙනවා මේවා හිතලම."**

රවීනා හිතත් එක්ක අරගලයක්ය.

**මේ යන ගමන් අලුත් මුට්ටියක් ගමු නේද? හොඳ එකක් තෝරන්න ඔයාට පුළුවන් වෙයි නේද?**

**"මොකද ඔය ඔලුව බදාගෙන?"** කාර්යාලයේ මිතුරිය පවනි ඇසුවේ රවීනාගේ අමුතු ඉරියව්ව නිසා ඇති වුණු කුතුහලය නිසාය.

**"අවුරුද්ද සමරන්න මට අපේ ගෙදර යන්න බැරි වෙයිද පවනි?"**

රවීනා ඇසුවේ අසරණ හඬින් වුණත් පවනි එයට හිනා වුණේ උස් හඬිනි.

**"පිස්සුද රවීනා... මාත් යන්නේ අපේ හස්බන්ඩ්ගේ ගෙදර.**

**ඊට පහුවද තමා අපේ ගෙදර යන්නේ. අපෝ නැති ප්‍රශ්න නම් දාගන්න එපා ගෙදර යන්න ඕනේ කියලා. ඕනෙම දේක සිරිතක් විරිතක් කියලා දෙයක් තියෙනවනේ."**

පවනි කීවේ රවීනා නිවසට මොන තරම් නම් බැඳී ඇත්දැයි කියා දන්නා නිසාය.

ඉතින් රවීනා ඒ ගැන තවදුරටත් සිතීම අත්හැර දැමුවාය.

**"අපි යමුද චානු අම්මලාට ඇඳුම් ගන්න?"**

සවස්වරුවේ රවීනා චානකගෙන් විමසුවාය.

**"හ්ම්... මාත් ඔයාගෙන් අහන්න හිටියේ කවදටද යන්න පුළුවන් කියලා. අනිද්දට නම් මට කලින් ඔෆිස් එකෙන් එන්න පුළුවන් වෙයි. ඔයාට පුළුවන්ද?"**

චානක අසද්දී රවීනා එයට එකඟ වුවාය.

දෙමව්පියන්ට සහ ඔවුන් දෙදෙනාට ඇඳුම් තේරූ පසු චානක හඬ අවදි කළේය.

**"මේ යන ගමන් අලුත් මුට්ටියක් ගමු නේද? හොඳ එකක් තෝරන්න ඔයාට පුළුවන් වෙයි නේද?"**

චානක අසද්දී රවීනා හැරී බැලුවේ කුතුහලයෙනි.

**"මුට්ටියක්? ඒ ඇයි?"**

**"ඇයි අපි දෙන්නා මෙද**

**"අනේ මට නම් බැහැ අවුරුද්දට චානකගේ මහගෙදර යන්න. එක්කෝ එයා එයාගේ ගෙදර ගියදෙන්. මම අපේ ගෙදර යනවා**

**සැරේ චාරිත්‍ර ටික තනියම කරන්න එපැයි."**

චානක කියද්දී රවීනා පුදුමයට පත් වූවාය.

**"මොකක්? අපි දෙන්නා තනියම? ඇයි අපි ඔයාලගේ මහගෙදර යන්නේ නැද්ද?"**

රවීනා ඇසුවාය.

එයට චානක පිළිතුරු දුන්නේ මඳ සිනාවකිනි.

**"දැන් අපි පවුලක්. අපිට තාම දරුවෝ නැති විත්තිය ඇත්ත.**

**ඒ වුණාට මේ අලුත් පවුලේ අම්මා ඔයා. තාත්තා මම. ඒ නිසා මම නම් හිතුවේ අපේ ගෙදර අලුත් අවුරුද්ද සමරන්න. ඔයාට යන්න ඕනෙද මහගෙදර? ඔයාට ඕනෙමනම් යමු."**

චානක කියද්දී රවීනා කලබල වූවාය.

**"නැහැ. නැහැ. අපි අපේ ගෙදර අවුරුද්ද සමරමු. ඒත්... අපිට හරියට චාරිත්‍ර ටික කරගන්න පුළුවන් වෙයි නේද? මුකුත් අඩුපාඩුවක් වෙන එකක් නැහැ නේද?"**

**"අඩුපාඩු වුණත් මොනවා වෙන්නද අනේ? අපි දෙන්නනේ.**

**අපි දන්න විදිහට චාරිත්‍ර ටික කරමු. ඊට පස්සේ අපේ මහගෙවල් දෙකට ගිහින් එමු. එහෙම හොඳයි නේ?"**

චානක කියද්දී රවීනාට දැනුණේ විසල් සතුටකි. සැනසිල්ලකි.

**සමාධි ඩයස්**

අප්‍රේල් 14
තරුව සමග
පලාපල පොතක්




නැකැත් සීට්ටුව
ලග්නයෙන් ලග්නයට
ක්‍රිෂ්ණ මූර්ති පද්ධතියෙන්
උපන් නැකතට
අංක විද්‍යාවෙන්
පංච පක්ෂි ක්‍රමයෙන්
පලාපල ඇතුළු
විශේෂ අවුරුදු ලිපි රැසක්

අප්‍රේල් 11 සඳුදා සිට වෙළෙඳපොළේ

වැඩියෙන්ම අලෙවි වන ජ්‍යොතිෂ පත්‍රය
තරුව
ඔබට ජය මග පෙන්වයි

# පෝලිමේ ඉඳලා ගෙනාපු පෙට්‍රල් කෑන් එකක් පුංචි පුතෙකුට දිවි අහිමි කරයි



මෙවර පාසල් නිවාඩුව කලින්ම ලැබුණොත් පුංචි මධුෂික හිටියේ ගෙදරය. නව හැවිරිදි වියේ පසුවූ ඔහු ඉගෙනුම ලැබුවේ හෙම්මාතගම දේවි බාලිකා ප්‍රාථමික විද්‍යාලයේයි. ඔහු එහි හතර ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියේය. මධුෂික පවුලේ බඩපිස්සා වූයෙන් ඔහු කරන ඇතැම් වැඩවල දඟකාරකම්ද නොතිබුණා නෙවේ.

ඉකුත් (4) සඳුදා දිනද, ඔහු එවන් දඟකාරකමක් කරන්නට සිතා සිටියා විය හැකිය. එහෙත් ඊට දෛවය හරස්වූයේ පුංචි පැංචා අඟුරු ගොඩක් බවට පත්කරය. ඔහු එසේ අඟුරු ගොඩක් බවට පත්වූයේ තාත්තා ඉන්ධන පෝලිමේ පැය ගණනක් සිට ගෙනා පෙට්‍රල් ගැලුමට ගිනි ඇවිලීයාමෙනි.



මියගිය මධුෂික

මධුෂිකට අයියා කෙනෙකුත්, අක්කා කෙනෙකුත් සිටින අතර ඔවුන්ද පාසල් වයසේ පසුවන්නන්ය. ගෙදර ගමන් බිමන්වලට ත්‍රීරෝද රථයක් වාගේම යතුරුපැදියක්ද ඔවුනට තිබුණි. එදින උදයේ පියා සුපුරුදු පරිදි ත්‍රීරෝද රියෙන් රැකියාවට ගියේය. අම්මා වැඩිමල් දියණිය සමඟ කෑගල්ලට ගියේ ඇයගේ පාසල් අස්වීමේ සහතිකය ගෙන ඒම සඳහායි. පොඩි පුතු මධුෂිකත් ලොකු පුතුත් සිටියේ ගෙදරය. එසේ ඉන්නා අතුරතුර මධුෂික අයියාටද නොකියා අත්තම්මාගේ ගෙදරට ගොස් ඇත.

**"පෙට්‍රල් කෑන් එක අම්මලගේ ගෙදර තියමු. පොඩ්ඩට අහුවෙන්න තියන්න හොඳ නැහැ. මෙයා ඕවා අදින්න පුළුවන්."**

මධුෂිකගේ පියා මවට කීවේ වැඩි ආරක්ෂාව ගැන සිතාය. එම ගැලුමෙහි පෙට්‍රල් ලීටර් පහක්ම තිබුණි. පොඩි පුතු පාසල් ගියේත්, පන්ති ගියේත් මව සමඟ යතුරුපැදියෙනි. බිරිඳට ඉන්ධන පෝලිමේ රස්තියාදු වෙන්නට නොහැකි බැවින් ඔහු එම ඉන්ධන කලින්ම ගෙදර ගෙනැත් තැබුවේ කිසිදිනක මෙවන් විපතක් වේ යැයි සිතා නොවේ.

එහෙත් සඳුදා උදේ මධුෂික තරමක් අසනීපයෙන් සිටිනා ආච්චි අම්මාගෙන් ඉල්ලා සිටියේ ගිනි පෙට්ටියකි. ගිනි පෙට්ටි නැතැයි කී විට ඔහු නිකං සිටියේ නැත. මේසය කෙළවරේ වූ ගිනි පෙට්ටිය දුටුවෙන්, ඔහු එය රැගෙන ගියේ පෙට්‍රල් ගැලුම තිබුණු කාමරයටය. ඔහු එහිදී ගිනිකූරක් දල්වා තිබේ. "**මාව බේරගන්න**" යැයි පොඩි එකා කෑගහන හඬ ආච්චි අම්මාට ඇසී තිබේ.

ඒත් එක්කම කාමරය එකම ගිනි ජාලාවකින් වැසී ගියේය. අසල්වැසියන් එනවිටත් ගින්න පැතිරී ගොසිනි. ඔවුන් ඒ ගිනිදැල් නිවන්නට උත්සාහ කළත් ඊට බොහෝ වේලා ගතවුණි. ඒ පෙට්‍රල් ගිනිදලු එතරම්ම බිහිසුණු නිසාය.

**"දරුවා මොනවහරි හොයන්න ගිනිකූරක් ගැහුවද දන්නෙත් නැහැ. මොකද ඒ වෙලාවේ විදුලිය විසන්ධි වෙලා තිබුණු වෙලාවක්. එහෙම නැත්නම් පෙට්‍රල් වාෂ්ප වෙලා තිබුණද දන්නෙත් නැහැ. මං දරුවට කිව්වම ගිනි පෙට්ටි නෑ කියලා කොහේද තිබිලා ගිනි පෙට්ටියක් හොයාගත්තා."**

ඒ මධුෂිකගේ ආච්චි අම්මා කියන කතාවය. හෙම්මාතගම පොලිසිය සඳහන් කළේ සඳුදා උදෑසන අටයි තිහට පමණ මෙම ගිනි ඇවිලීම සිදුව ඇති බවත්, එම ස්ථානයේදීම පිළිස්සුම් තුවාල ලබා දරුවා මියගොස් සිට ඇති බවත්ය.

**ආච්චි අම්මගෙන් ගිනි පෙට්ටිය ඉල්ලලා. නෑ කිව්වම එයාම එකක් හොයාගෙන ගිනිකූරක් දල්වලා**

**මහගෙදර කෑන් එක හැංගුවෙත් කොල්ලා ඒක හොයාගනීවි කියන බයටලු**

**"මහගෙදර සිටින්නේ මගේ මව පමණයි. ඇය අසූපස් හැවිරිදි වියේ පසුවනවා. ඇස් පෙනීමත්, කන් ඇසීමත් අඩුයි. මමයි, බිරිඳයි, මියගිය පොඩි පුතයි රෑට නිදාගන්නේ එහේ.**

**උදේට ගෙදරට එනවා. පුතා දකින්න ඇති එහේ කාමරේ පෙට්‍රල් ගැලුම තියෙනවා. බිරිඳට පෝලිම් ගානේ රස්තියාදු වෙන්න බැරි නිසයි තෙල් ගැලුම ගෙනාවේ. ඒක මේ තරම් විනාශයක් සිදු කරාවි කියලා හිතුවේ නැහැ."**

ඒ මධුෂිකගේ පියාගේ හඬයි. මෙම ගිනි ගැනීමෙන් පුංචි මධුෂිකව හඳුනාගන්නට බැරි තරමට පිළිස්සී තිබුණි. ඒ වගේම ගිනි ගැනීම ඇතිවූ කාමරයද මුළුමනින්ම විනාශ වී ගොසිනි.

සිද්ධිය සම්බන්ධයෙන් හෙම්මාතගම පොලිසිය මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු දැක්වීමෙන් අනතුරුව එහි වැඩ බලන මහේස්ත්‍රාත් ඩබ්ලිව්.ඒ.එන්.ජයනාත් මහතා පැමිණ ගිනි ගැනීමට ලක්වූ නිවසේ ස්ථානීය පරීක්ෂණයක් සිදුකළේය. අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට මෘත දේහය කෑගල්ල ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරන ලෙස නියෝග කෙරිණි.

ඒ අනුව ඉකුත් (5)දා එම දේහය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කෙරිණි. හෙම්මාතගම පොලිසියේ සැරයන් පත්මසිරිගේ (59599) මූලිකත්වයෙන් මෙහි විමර්ශණ කටයුතු සිදුකෙරිණි.

දින කිහිපයකට කලින් කෙළිදෙළෙන් ගේ පුරා දුව පනිමින් සිටි පුංචි දඟකාරයා අද නොපෙනෙන ලොවකය. මධුෂිකගේ අක්කාත්, අයියාත් ශිෂ්‍යත්වය සමත්ව හොඳින් ඉගෙනුම් කටයුතුවල යෙදුනෙන් ඒ දෙමාපියන්ට පොඩි පුතු ගැන තිබුණේද එවන්ම බලාපොරොත්තු කන්දරාවකි. එහෙත් ඒ සිහිනය දැන් බොඳව ගොසිනි.

රටේ ඇතිවූ ඉන්ධන හිඟයත් සමඟ බොහෝදෙනෙක් ගැලුම්වලට දමාගෙන ඉන්ධන ගෙදරට ගෙනාවෝය. මධුෂිකගේ තාත්තා කළෙත් එයයි. ඒ මෙවන් විපතක් වන බව දැනගෙන නොවේ. මේ කියවන තවත් බොහෝදෙනෙකුටද අද ඇත්තේ එවන් විසඳුම්ය. එහෙත් එම ඉන්ධන ඇතැම්විට ගබඩා කරන්නේ කාමරවලයි. එසේ තැන්පත් කළ ඉන්ධන ගැලුම් පුපුරා ගිනි ගැනීම් සිදුවූ පළමු අවස්ථාවද මෙය නොවේ.

ඉකුත් සතියේ කොළඹ ජතික රෝහල මගින් නිකුත් කළ නිවේදනයක සඳහන් වූයේ දිනකට ඉන්ධන ආශ්‍රිත පිළිස්සුම් තුවාල ලබා පුද්ගලයින් සිව්දෙනෙකුවත් රෝහල්ගත කෙරෙන බවයි. දින හතරකට වරක් එවන් පිළිස්සුම් ලබන අයෙකු මියයන බවයි. එසේ නම් මෙය කොතරම් බැරෑරුම්දැයි අමුතුවෙන් කිව යුතු නැත. විශේෂයෙන්ම කුඩා දරුවන් සිටින නිවෙස්වල වැඩිහිටියන් මේ පිළිබඳව වරක් දෙවරක් නොව කිහිපවරක්ම සිතා බැලිය යුතුය. ඒ පුංචි මධුෂිකට සිදුවූ දෙය තවත් දරුවෙකුට සිදු නොවන්නටය. තවත් අම්මා තාත්තා කෙනෙකුට මධුෂික වැනි සුරතල් දරුවෙකු අහිමි නොවන්නටය.

දීපා වසන්ති එදිරිසිංහ

# එක රැයින් ලස්සන වෙන්න හදන අය කියවීම තහනම්!

16 වැනි සියවසේදී එංගලන්තයේ සමහර ප්‍රදේශවල බොහොම දරුණු විදියට වසූරිය කියන වසංගතය පැතිරිලා තියෙනවා. ඉතින් ඒ කාලේ රටේ රැජිනිය වෙච්චි පළමුවැනි එලිසබත්ටත් මේ වසංගතය වැළඳුණාලු. හැබැයි වාසනාවට වගේ රැජිනියට පණ කෙන්ද බේරගන්න පුළුවන් වෙලා තියෙනවා. ඒත් රෝගය නිසා සඳ වගේ තිබුණු ඇගේ මුණ පුරා ලප කැළැල් ඇතිවෙලා. පළමුවැනි එලිසබත් රැජින රූපය ගැන හරියට හිතපු කෙනෙක්නේ. ඉතින් ඊටපස්සෙ ඇය මේ ලප කැළැල් නැති කරගන්න බිත්තර සාරු, මුහුදු වැලි, විනාකිරි වගේ නොයෙකුත් දේවල් මුහුණේ ආලේප කළාලු. මේ විදියට රටේ රැජිනිය මුහුණට විවිධ දේවල් ආලේප කරනවා දැකපු අනිත් කාන්තාවොත් ඇයව අනුගමනය කරන්න පටන් අරන් තියෙනවා. මම ඒ කිව්වේ එංගලන්තයේ ගෑනු උදවිය මුහුණට සත්කාර කරන්න හුරුවුණු හැටි. මුහුණ ලස්සන කරන්න ඔය විදියට ආලේප කරන දේවල්වලට දැන් නම් අපි කියන්නේ ෆේෂල් මාස්ක් නැත්නම් ෆේෂල් පැක් කියලයි.

ඉතින් පළමුවෙනි එලිසබත් විතරක් නෙමෙයි ප්‍රංශ විප්ලවය කාලෙදි **"පාන් නැත්නම් කේක් කාපල්ලා"** කියාපු ප්‍රංශයේ මාරි ඇන්ටොනිට් රැජිනත් මුහුණ තිරිඟන් කරගන්න ඔය විදියේ සොබාවික දේවල් මුහුණට ආලේප කළාලු. ඉතින් එහෙම බැලුවම ඒ කලේ රැජිනියො තමන්ගේ ලස්සන රැකගන්න උත්සාහ කරලා තියෙන්නේ ස්වභාවික ක්‍රමවලින් කියන එක හරි පැහැදිලියි. හැබැයි අද කාලේ නම් ගොඩක් අය උත්සාහ කරන්නේ එක රැයින් ලස්සන වෙන්න. ඒ දේවල් හරිම තාවකාලිකයි කියන එකත් නොකියම බැහැ. හැබැයි එහෙම නැතුව ස්වාභාවික දේවල්වලින් ලස්සන වෙන්න කැමති අයත් ඉන්නවනේ. අන්න ඒ අයට ගෙදරදිම කරගන්න පුළුවන් ෆේෂල් පැක් ටිකක් ගැන තමයි මේ කියන්නේ.

ඒ කාලේ රැජිනියෝ භාවිතා කරපු අදටත් වලංගු සත්කාර ටිකකුත් මේ අතර තියෙනවා. ඉතින් හරි විදියට මේ සත්කාර ටික කළොත් ඕනම කෙනෙක්ට රැජිනක් වගේ ලස්සනට ඉන්න පුළුවන්.

අපි ෆේෂල් මාස්ක් එකක් භාවිතා කරන්න ඕනේ ඇයි කියන කාරණාව ගැන මුලින්ම ටිකක් කතා කරමු. විටමින්, ඛනිජ ලවණ, කොලජන් වගේ සමේ පෝෂණයට අවශ්‍ය කරන සංඝටක අන්තර්ගත වෙච්චි අමුද්‍රව්‍ය කිහිපයක එකතුවක් තමයි සාමාන්‍යයෙන් අපි ෆේෂල් මාස්ක් එකක් විදියට මුහුණට ආලේප කරන්නේ.

මේ වගේ ෆේෂල් පැක් එකක් මුහුණට ආලේප කළාම ඒ පෝෂ්‍ය කොටස් ඉක්මනටම අපේ සමට උරාගන්නවා. එතකොට සමේ තියෙන ලප කැළැල් එහෙමත් පහසුවෙන් ඉවත් කරන්න පුළුවන්. අවපැහැ ගැන්වුණු සම පැහැපත් කරන්නත්, ෆේෂල් මාස්ක් එකක් භාවිතා කරන්න පුළුවන්. සම රැලි වැටීම අවම වීම, මැරුණු සම ඉවත් වීම විතරක් නෙමෙයි සමේ තෙතමනය රැකගැනීම වගේ ගොඩක් පල ප්‍රයෝජන ෆේෂල් මාස්ක් එකකින් අපිට ලබාගන්න පුළුවන්.

විටමින්, ඛනිජ ලවණවලින් අනූන දේවල් මුහුණේ ගෑවම මුණ ලස්සන වෙනවා කියලා ඉස්සර ස්පාඤ්ඤයේ ඉඳපු ගෑනු අයත් දැනගෙන. ඒ කාලේ ස්පාඤ්ඤයේ පිඟන් මැටි කර්මාන්තය හරි හරියට සිද්ධවෙන කාලෙලු. පිඟන් මැටිවල සමට ගුණ විශේෂිත ඛනිජ ලවණයක් තියෙනවා කියලා දැනගත්තු බවලතියෝ ටික රටේම තියෙන පිඟන් මැටි හොය හොයා මුණේ ගාන්න ගත්තලු. ඉතින් ඒ කර්මාන්තය කරන උදවියට ගෑනුන්ගෙන් පිඟන් මැටි බේරගන්න මහ විශාල රැකවල් දාන්න වුණා කියලා තමයි කියන්නේ.

ෆේෂල් මාස්ක් ගැන කතා කරද්දී ඉන්දියාව පැත්තටත් නොගිහින්ම බැහැ. ඒ කාලේ, ඒ කියන්නේ අවුරුදු 5000කට විතර කලින් ජීවත්වුණායි කියන ඍෂිවරු මනස දියුණු කරලා මුහුණ පැහැපත් කරන සත්කාර වර්ග හොයාගත්තා කියනවනේ. ඔවුන් හොයාගත්තු ඒ ආයුර්වේද සත්කාර අදටත් ලෝකේ පුරාම ප්‍රසිද්ධයි. ඒ කාලේ ඉන්දියානු රජ කුමරියන් ඍෂිවරුන්ගේ උපදෙස් මත හෙල්ලි කුඩු, කෝමාරිකා, කොහොඹ, පොල් වතුරින් මිශ්‍ර කරලා මුහුණේ ආලේප කරනවලු. මේක නම් ඉතින් අදටත් වලංගු සත්කාරයක්.

මුල්තානි මිට්ටි, කෝමාරිකා සහ වද්කහ එකට මිශ්‍ර කරලා ආලේප කරන එකත් ඉන්දියාවේ බොහොම ප්‍රසිද්ධ ආයුර්වේද සත්කාරයක්ලු.

ඊජිප්තුවේ ක්ලියෝපැට්‍රා රැජිනියත් ලස්සන වෙන්න නොයෙක් මාදිලියේ ෆේෂල් පැක් වර්ග ආලේප කරලා තියෙනවා. ඇය නයිල් ගංගාව ආශ්‍රයෙන් හොයාගන්න කිඹුල් වසුරු මුහුණේ ආලේප කරලා පැය ගණනාවක් අඳුරු කුටියක රැඳී ඉන්නවලු. ඔන්න එතකොට අද්භූතමාන බලවේගයක් ඇවිල්ලා ඇගේ මුහුණ සුන්දර කරනවා කියලා තමයි ක්ලියෝපැට්‍රාගේ විශ්වාසය වෙලා තියෙන්නේ.

> වෙළඳපොළේ මිලදීගන්න ෂීට් මාස්ක් ඕන හැටියේ තියෙනවා. ඒත් ඉතින් ගෙදරදිම ෂීට් මාස්ක් එකක් හදාගන්නත් බැරිකමක් නැහැ

ඒ වගේම ඇය මී පැණිවලට නැවුම් කිරි මිශ්‍ර කරලා පැක් එකක් විදියට මුහුණේ ආලේප කරලා. ඒ වගේම ඔලිව් තෙල් සහ මී පැණිත් එකට මිශ්‍ර කරලා ආලේප කළාලු. අර කලින් කිව් එක බැරි වුණත් මේ සත්කාර දෙක නම් කාට වුණත් කරන්න පුළුවන්.

චීනයේ යැං ගුයිෆෙයි කියලා පුරාණ සුරූපිනියක් ඉඳලා තියෙනවා. ඇය වයස්ගත වීම ප්‍රමාද කරගන්න මුංඇට කුඩුවලට කොළ පැහැති තේ කොළයි (ග්‍රීන් ටී), සහල් වතුරයි, මින්චි කොළයි එකතු කරලා හොඳට මිශ්‍ර කරලා මුහුණේ ආලේප කළාලු. මේක අදටත් චීනයේ කාන්තාවන් භාවිත කරන ප්‍රධාන රූපලාවණ්‍ය සත්කාරයක්.

මාස්ක් ගැන කතා කරද්දී ෂීට් ෆේෂල් මාස්ක් ගැනත් අපි කතා කරන්න ඕනේ. ෂීට් මාස්ක් ලෝකෙට හඳුන්වලා දීලා තියෙන්නේ කොරියානුවෝ. විවිධ අමුද්‍රව්‍යවල රෙදි ගිල්වලා තමයිලු ඒ කාලේ අය මේවා හදාගෙන තියෙන්නේ.

දැන් නම් ෂීට් ෆේෂල් මාස්ක් ලෝකේ පුරාම හරි ජනප්‍රියයි. අපි මුහුණේ ආලේප කරන සාමාන්‍ය ෆේෂල් පැක් එකකටත් වඩා මේ ෂීට් මාස්ක් පලදායිලු. පෝෂණය සමේ ගැඹුරටම කාවදින්න මේවා උපකාරී වෙනවා කියලා තමයි ප්‍රකට රූපලාවණ්‍ය ශිල්පියෝ කියන්නේ. වෙළඳපොළේ මිලදීගන්න ෂීට් මාස්ක් ඕන හැටියේ තියෙනවා. ඒත් ඉතින් ගෙදරදිම ෂීට් මාස්ක් එකක් හදගන්නත් බැරිකමක් නැහැ.

මේ වැඩේට බොහොම සියුම් කොටන් රෙදි කෑල්ලක් වගේම සහල් ටිකකුත් අවශ්‍යයි. රෙදි කෑල්ල මුහුණේ හැඩයට කපාගෙන ඇස්වලටයි නහයටයි සිදුරු තියාගන්න. පස්සේ මේ රෙදි කැබැල්ල සහල් වතුරේ රැයක් විතර පොඟවා ගන්න. ඊටත් පස්සේ ඒක විනාඩි 20-30ක් ශීතකරණයේ තියලා අරගෙන විනාඩි 15ක් විතර මුහුණේ තියාගෙන ඉන්න. මේකට සහල් වතුර වෙනුවට ටී-ට්‍රී තෙල්, රෝස වතුර, පිපිඤ්ඤා යුෂ, කෝමාරිකා යුෂ එහෙමත් යොදාගන්න පුළුවන්.

අතීත බවලතියෝ භාවිතා කරපු ඒ ෆේෂල් මාස්ක්වලට අමතරව ගෙදරින් හදාගන්න පුළුවන් තව ෆේෂල් මාස්ක් කිහිපයක් ගැනත් අපි ඔයාලට කියන්නම්.



> සම රැලි වැටීම අවම වීම, මැරුණු සම ඉවත් වීම විතරක් නෙමෙයි සම තෙතමනය කිරීම වගේ ගොඩක් පල ප්‍රයෝජන ෆේෂල් මාස්ක් එකකින් අපිට ලබාගන්න පුළුවන්

> හරි විදියට මේ සත්කාර කරනවා නම් ඕනම කෙනෙක්ට රැජිනක් වගේ ලස්සනට ඉන්න පුළුවන්

තම්බපු අර්තාපල් ගෙඩියක් අරගෙන ඒකට මිකිරි, මී පැණි, දෙහි යුෂ, වද්කහ ටිකක් කාරිය එකතු කරලා හොඳට මිශ්‍ර කරලා මුහුණේ ආලේප කරන්න.

කොකුම් පොතු, වැල්මී, වද්කහ මිශ්‍ර කරලා ආලේප කරන එකත් මුහුණට හොඳයි.

මේ ඕනම ෆේෂල් මාස්ක් එකක් ආලේප කරන්න කලින් මුහුණ හොඳට ක්ලෙන්සර් කරගන්න. ක්ලෙන්සර් නැත්නම් ෆේස් වොෂ් ටිකක් දාලා හොඳට මුහුණ පිරිසිදු කරගන්නත් පුළුවන්. ෆේස් පැක් ගෑවා කියලා එක දවසින් මුහුණ පැහැපත් වෙන්නේ නැහැ කියලා අපි කිව්වනේ.

ඒ නිසා සතියකට එකපාරක්වත් මේ සත්කාර කරන්න ඕනේ. ඒ වගේම මේවා විනාඩි 20කට වඩා මුහුණේ තියන එකත් සුබ නැහැ. ඒකෙන් මුහුණ වියැලෙන්න ඉඩ තියෙනවා. වෙළඳපොළෙනුත් විවිධ මාස්ක් වර්ග ගන්න පුළුවන්. වියළි සමක් තියෙන කෙනෙක් නම් ක්‍රීම් වර්ගයේ මාස්ක් එකක් මිලදී ගන්න. එතකොට සාමාන්‍ය සමට ගැළපෙන්නේ ජෙල් මාස්ක් වර්ග. කුරුලෑ, කළු ලප තියෙන සමක් නම් ක්ලේ මාස්ක් එකක් වඩාත් හොඳයි. මාස්ක් එක ඉවත් කළාට පස්සේ සම ටෝනර් කරන එකත් වැගත්. ඒකට පිපිඤ්ඤා යුෂ ටිකක් නැත්නම් අයිස් වතුර ටිකක් වුණත් යොදගන්න පුළුවන් ඔන්න.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධව සිට පුනරුත්ථාපනය වූ කතුන්ගේ සුබිත මුදිත ජීවිත කතා පෙළ - 04 වැනි කොටස**


# ශාලිනී යටත්වෙලා තිබුණේ බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වාගේ 58 සේනාංකයට

**සංගීත ගුරුවරියක් මෙන්ම ක්‍රීඩිකාවක ලෙසද දස්කම් දක්වා ඇති කපිතාන් ජයනි හේරත් කලක් අධ්‍යාපන අමාත්‍යංශයේ ක්‍රීඩා සංවිතයේත් රාජකාරි කර ඇත. 1996දී දෙවන ලුතිනන්වරියක ලෙස ජාතික ශිෂ්‍ය භට බළකායට එක්වූ ඇය 2006 වසරේදී සක්‍රීය හමුද සේවයට එක්වී ඇත. පසුව ඇය යුද සමයේ අවසාන කාලයේදී හමුද භාරයට පත්වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකාවන්ගේ පුනරුත්ථාපන රාජකාරියටද එක්වූ අතර එලෙස පුනරුත්ථාපනය වූ කොටි සාමාජිකාවන් ගැන කපිතාන් ජයනි හේරත් කියන කතා පෙළයි මේ.**





මේජර් ජනරාල් දයා රත්නායක



ශාලිනී ඇතුළු සාමාජිකාවන් හමුදාවට යටත්වූ අවස්ථාව

පුනරුත්ථාපනය වීම සඳහා පැමිණ සිටි එල්.ටී.ටී.ඊ. තරුණියන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව ඉකුත් සතියේදී සඳහන් කළෙමි. එලෙස අධ්‍යාපන කටයුතු සිදුකරගෙන යාමේදී හමුවූ අමතක නොවන චරිතයක් පිළිබඳව කපිතාන් ජයනි සිය මතකය අවදි කළාය.

**"පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ඉඳපු තරුණියන්ට අධ්‍යාපනය ලබා දෙද්දී අපි මුහුණ දීපු ගැටලුවක් තමයි එතැන ඉඳපු සමහර ළමයින්ට තමන්ගේ මව් භාෂාව ඒ කියන්නේ දෙමළ භාෂාව ගැන මූලික දැනුමක්වත් නොතිබුණු එක. මොකද සමහර ළමයි එක එක හේතු මත පාසල් යන්නේ නැතිව ඉඳලා කරන්නම දෙයක් නැතිව කොටි සංවිධානයට බැඳිලා. අකුරු බැරි නිසා මුලින්ම අපට කරන්න සිද්ධ වුණේ එයාලට දෙමළ අකුරු උගන්නන එක. ඒ සඳහා හිටපු නිලධාරීන් ප්‍රමාණවත් වුණේ නැහැ."**

ඒ වනවිට අඹේපුස්ස පුනරුත්ථාපන මධ්‍යස්ථානය භාර නිලධාරී ලෙස කටයුතු කළ කර්නල් හර්මන් ප්‍රනාන්දු ඒ ගැටලුවට විසඳුමක් සොයමින් සිටියේය. ඉන්පසු මෙම ගැටලුව විසඳීමට ඉදිරිපත් වූයේ කොළඹ පිහිටි **'ලක්ෂ්මන් කදිරගාමර් අනුස්මරණ පදනම'**යි. (කොටි සංවිධානය විසින් ඝාතනය කරන ලද එවකට විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහතා අනුස්මරණය සඳහා පිහිටුවන ලද්දකි) කොටි ප්‍රහාරයකින් මියගිය ලුතිනන් ජනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුවගේ දියණියකද එහි සේවය කරන ලදී. එල්.ටී.ටී.ඊ. තරුණියන් සඳහා අධ්‍යාපනය ලබාදීමට බාහිරව සේවය සපයා ගන්නා ගුරුවරුන් සඳහා වැටුප් ගෙවීමට ලක්ෂ්මන් කදිරගාමර් පදනම ඉදිරිපත් විය. ඒ අනුව වරකාපොල ප්‍රදේශයේ පාසලක රාජකාරි කළ නසීරා නම් විදුහල්පතිනියක ඇතුළු කීපදෙනෙකු පැමිණ එහි සිටි තරුණියන්ට අධ්‍යාපන කටයුතු සඳහා සහාය දෙන ලදී. මෙහිදී ඉංග්‍රීසි භාෂාව උගන්වන ලද්දේ ශාලිනී (අන්වර්ථ නාමයකි) නමැති කොටි සාමාජිකාවයි. ඇය ගැන කපිතාන් ජයනිට ඇත්තේ මෙවැනි මතකයකි.

**"ශාලිනී යුද හමුදාවට භාරවෙද්දී ඉංග්‍රීසි ගුරුවරියක් වුණත් අපි ළඟට ඇවිත් ඒ කතාව කීවේ නැහැ. අපිත් එයා පුහුණු ඉංග්‍රීසි ගුරුවරියක් කියලා දැනගත්තෙ ටික දවසකින්. ඊටපස්සෙ තමයි ඉංග්‍රීසි උගන්වන රාජකාරිය ශාලිනීට බාරදුන්නේ. එයා ඒක හොඳට කළා. ඒ නිසා ළමයින්ගේ කණ්ඩායමේ නායකත්වයත් එයාටම දුන්නා. ශාලිනී අපේ උපදෙස් අනුව හොඳට වැඩ කළා. එයා මැදිහත් වෙලා වෙලාවට ළමයින්ව පෝලිම් කරන එක, කාලසටහනට අනුව වැඩ කරන එක වගේ ඔක්කොම දේවල් මූලිකත්වය අරගෙන කළා. එතැන ඉඳපු නිලධාරීන් වැඩි පිරිසක් ගුරු සේවයේ ඉඳලා හමුද සේවයට ආපු අය නිසා අපිත් එක්ක ශාලිනී හිතවත් වුණා. මට කීප අවස්ථාවකදීම ශාලිනී එක්ක වැඩිපුර කතා කරන්න අවස්ථාව ලැබුණා. එතකොට තමයි එයාගෙ විස්තරය දැනගන්න ලැබුණේ.**

**ශාලිනී හොඳ වැදගත් පවුලක කෙනෙක්. එයා කෝපායි අධ්‍යාපන විද්‍යා පීඨයෙන් පුහුණුවෙලා තමයි ගුරු සේවයට එකතු වෙලා තිබුණේ. මුල්ම පත්වීම ලැබිලා තිබුණේ කිළිනොච්චිය මහ විදුහලට. එතැන ගුරුවරියක් විදියට වැඩ කරද්දි තමයි කොටින්ගෙ අනිවාර්ය යුද සේවය කියන නීතිය ඇවිත් තිබුණේ. මගේ මතකයේ හැටියට ශාලිනීගේ පවුලේ තුන්දෙනයි. මල්ලි හෙද විදුහලේ පුහුණු වෙමින් ඉඳලා තියෙන්නේ. නංගි උසස් පෙළ පංතිවල ඉඳලා තියෙන්නේ. මෙයා නංගිවයි, මල්ලිවයි බේරන්න ඕන නිසා මම එන්නම් කියලා බැඳිලා තියෙනවා. 'නංගිගෙයි මල්ලිගෙයි ජීවිතේ අඳුරු කරන්නේ මොකටද කියලා මමම ඉදිරිපත් වුණා' කියලා තමයි කීවේ.**

**සංවිධානයට බැඳුණට පස්සේ මාස කීපයක ගරිල්ලා පුහුණුවක් ලබලා තියෙනවා. පුහුණුවෙන් පස්සේ කෙළින්ම සටන් බිමට තමයි යවලා තියෙන්නේ. මාස ගාණක් මේ විදියට සටනෙම ඉඳලා තියෙනවා. හැබැයි මෙයා කොටි සාමාජිකාවක් විදියට හිටියට ඉස්කෝලේ වැටුප ලැබිලා තියෙනවා. කොටි, ඒ පාසලේ විදුහල්පතිට නියෝග කරලා තියෙනවා රාජකාරි කරන විදියට සටහන් දාන්න කියලා. 2008 වෙද්දි කිළිනොච්චිය පුනරීන් ප්‍රදේශයේ ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරිය කරලා තියෙන්නේ. යුද හමුදාවට කොහොමටත් ඉදිරියට එන්න ඉඩ තියන්නෙ නැතිව ප්‍රහාර එල්ල කරන්න කියලා තමයි නියෝග ලැබිලා තියෙන්නේ."**

**දැන් ශාලනී විවාහ වෙලා දරුවෝ දෙන්නෙකුත් ඉන්නවා. මීගමුව ප්‍රදේශයේ පාසලක තමයි රාජකාරි කරන්නේ. එයත් එක්කම යටත් වුණු කාර්ණිකා, සෝබනා කියලා ළමයි දෙන්නත් අපි ළඟ ඉඳලා නිදහස් වුණා. එක්කෙනෙක් විදේශගත වුණා**

ඒ වනවිට වන්නි මානුෂීය මෙහෙයුමේ නිරත යුද හමුදාවේ 58 සේනාංකය මන්නාරමේ සිට වයඹ වෙරළ තීරය ඔස්සේ පැමිණ පුනරින් ප්‍රදේශය අත්පත් කරගැනීම සඳහා සිය ප්‍රහාර එල්ල කරමින් සිටියෝය. 58 සේනාංකයේ ප්‍රධාන අණදෙන නිලධාරී වූයේ එවකට බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා (වත්මන් යුද හමුදාපති) ය. එම මෙහෙයුමේදී ශාලිනීට අත්වූ ඉරණම විස්තර කළ කපිතාන් ජයනි;

**"ශාලිනී ඉඳපු බංකරයේ හයදෙනෙක් ඉඳලා තියෙනවා. කොහොමහරි හමුදාවේ ප්‍රහාරය වැඩිවෙද්දි බංකරයේ ඉඳපු එක්කෙනෙක් වෙඩි වැදිලා මැරිලා. තවත් දෙන්නෙක් තුවාල වෙලා. යුද හමුදාව ප්‍රහාර එල්ල කර කර ළඟටම එද්දි එතැන ඉඳපු එක්කෙනෙක් තමන් ළඟ තිබුණු අත් බෝම්බයක් පුපුරුවාගෙන මැරිලා. ඒ පිපිරුමෙන් තව කෙනෙක් මැරිලා. බෝම්බ කෑලි වැදිලා ශාලිනීටත් තුවාල වෙලා. කොහොමහරි අවසානයට ඉතුරුවෙලා තියෙන්නේ තුන්දෙනයි. මෙයාලගෙ පතරොම් එහෙමත් ඉවර වෙලා. යුද හමුද විශේෂ බළකායේ (SF) භටයන් බංකරය ළඟටම ඇවිත් වටකරනකම් මේ අය දන්නේ නැහැලු. ඊටපස්සේ යටත් වෙන්න කියලා. ඒ වෙලාවේ තුන්දෙනාම සයනයිඩ් කාලා සියදිවි නසාගන්න හදලා. අවසාන තත්පරයේදී ඒ අදහස වෙනස් කරලා යුද හමුදාවට යටත්වෙලා තිබුණා. ශාලිනී තවත් විශේෂ දෙයක් කීවා. හමුදාවට යටත් වුණාට එයාලට ජීවිතේ ගැන විශ්වාසයක් තිබිලා නැහැ. යුද හමුදාවෙන් වද දීලා මරාවි කියලා සැකයකුත් හිතේ තිබිලා තියෙනවා. කොහොමහරි තුන්දෙනාවම බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා සර් ළඟට එක්කරගෙන ගිහින්. ශාලිනී කීවා එයා කොටි සාමාජිකාවක් විදියට ඉද්දි එයාලා යුද හමුදාවේ ප්‍රධානීන් ගැන කතා කරනවලු. එතකොට සමහරු කියනවලු ශවේන්ද්‍ර සිල්වා කියන්නේ නපුරු හමුද නායකයෙක් නෙමෙයි කියලා. ඒ නිසා ශවේන්ද්‍ර සිල්වා සර්ව දැක්කම මරණ එකක් නැහැ, ජීවිතේ බේරුණා කියලා හිතුණාලු.**

**ශාලිනී අඹේපුස්ස කඳවුරේ හිටියෙ බොහොම කැමැත්තෙන්. මේජර් ජනරාල් දයා රත්නායක සර් කාලයක් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විදියට හිටියා. දයා රත්නායක සර් ආවම එයා තීරණය කළා පාලනයේ පහසුවට අඹේපුස්ස කඳවුර එතැනින් ඉවත් කරලා වව්නියාවට ගෙනියන්න. ඒ වෙලාවේ ශාලිනී වව්නියාවේ යන්න බැහැ කියලා, බලෙන් යැව්වොත් සියදිවි හානිකරගන්නවා කීවා.**

**ඒත් කොහොමහරි කැමති කරවගෙන වව්නියාවට යැව්වා. වව්නියාවට යවලා සති කීපයකින් ශාලිනීව නිදහස් කළා. එහෙම නිදහස් කරද්දි අඹේපුස්ස මධ්‍යස්ථානයේ ඉංග්‍රීසි උගන්නපු නිසා ඒ මාස කීපයම ගුරු වැටුප හදලා දුන්නා. දයා රත්නායක සර්ගේ අතින් තමයි වැටුප් චෙක් එක දුන්නේ. දැන් ශාලනී විවාහ වෙලා දරුවෝ දෙන්නෙකුත් ඉන්නවා. මීගමුව ප්‍රදේශයේ පාසලක තමයි රාජකාරි කරන්නේ. එයත් එක්කම යටත් වුණු කාර්ණිකා, සෝබනා කියලා ළමයි දෙන්නත් අපි ළඟ ඉඳලා නිදහස් වුණා. එක්කෙනෙක් විදේශගත වුණා."**

**"ඔයත් මාධ්‍යවේදියෙක් නිසා ඔයාටත් වැදගත් වෙන දෙයක් මෙතනදී කියන්නම්"** යනුවෙන් කී කපිතාන් ජයනි එකල සිදුවීමක් පිළිබඳ මතකය ආවර්ජනය කළාය.

**"අපි අඹේපුස්ස මධ්‍යස්ථානයේ ඉද්දි ශාලිනීගේ විස්තර ගන්න මාධ්‍යවේදියෙක් ආවා. මේ අය හමුවෙන්න සීමා තිබුණත් මේ මාධ්‍යවේදියා ආරක්ෂක අමාත්‍යංශයේ අදාළ ස්ථානවලින් අවසර අරගෙන ආවේ. ඒ මාධ්‍යවේදියා ශාලිනීගේ කතාව ඇහුවා. ශාලිනී එයාගේ කතාව කියද්දි 'සයනයිඩ් කන්නෙ නැතුව යුද හමුදාවට යටත් වුණේ ඇයි?' කියලා ප්‍රශ්නයක් ඇහුවා. ඒ ප්‍රශ්නය අහද්දි ශාලිනීට කඳුළු ඇවිත් ඇඬුණා.**

**'මරණය තෝරාගන්නේ නැතිව ජීවත්වීම තෝරාගත්තේ ඇයි කියලා අහද්දි කෙනෙක්ට ඇඬෙන්නෙ නැතිද?' කියලා ශාලිනී කීවා."**

**සනත් ප්‍රියන්ත**

## කොටි සංවිධානය ඇතුළේ කතාව තිබුණේ ශවේන්ද්‍ර සිල්වා නපුරු හමුදා නායකයෙක් නෙවෙයි කියලලු

**මෙතෙක් කතාව**

*විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය සිටි නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. ඒත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරඟයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සේපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවලු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරි වුණේය. ඒ අවස්ථාවේ කාටත් රහසින් සෙනෙහෙලතා මැණිකේ ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට නිවසක් මිලදී ගන්නට දුන්නාය. ඔහු නිවසක් මිලට ගත්තද එය අංජනාට සැඟවූයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට සේපාලිකාගේ බලාපොරොත්තුව විය. මේ අතර තේනුකගේ කේන්දරයේ සිකුරුගේ බලය වැඩිවූවා සේ ඔහු නොදැන මංගල යෝජනා දෙකක් පැමිණ තිබුණි. එකක් බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයාගේ සහෝදර ඇමතිවරයෙකුගේ දියණියකි. අනෙක තේනුකගේ මාමාගේ දියණිය චතුමිණිය. ඒ කිසිත් නොදැන තේනුක අංජනාව සමන් දේවාලය වන්දවන්නට කැඳවා ගියේය. විදේශයක සිට ලංකාවට පැමිණ සිටි චතුමිණි දෙමාපියන් සමඟ ඔහු බලන්නට ඒ අතරවාරයේ ඇමති නිල නිවසට පැමිණියාය.*

**අද එතැන් සිට**

> **මට ලංකාව එපා කරවන්න හදන්නෙ එයා. අම්මා දන්නවනෙ, මං මේ ලංකාවෙ ඉන්නෙ ඔයා හින්දා කියලා**

# අවසරයි

බියංකා නානායක්කාර ලියයි

**64 කොටස**

# අම්මා දැන් වැඩිපුර මාව බලන්න එන්නෙ නැත්තෙ සුදුපුතා නිසාද?



තේනුක තෙන්නකෝන් බණ්ඩාරගේ ඉවසීමේ සීමාවේ රතු කට්ට පනින්නට ඔන්න මෙන්නය. චතුමිණී රට රාජ්‍යවල ගොස් ඉගෙනගත්තද සවන් දීමට හෝ අසන්නක් සිහි බුද්ධියෙන් ඇසීමට ඉගෙනගෙන නැත. ඇය තේනුකව හිතෙන් අයින් කරන්නට සූදානමක් ඇත්තේම නැත.

**"හරි, මං ආයේ මේ ගැන ඔයත් එක්ක කතා කරන්නෙ නෑ නංගී. ඒ වගේමයි ඔය හිතේ තියෙන ඒවා වෙන්නෙත් නෑ. පුරුදුවෙන්න තමන් ගැන තීරණ ගන්න එක තමන් කරන්න. තමන්ගේ ජීවිතේ අනුන් අතට දෙන්න එපා."**

ඔහුගේ ස්වරයේ වූ කේන්තිය ඈ හඳුනාගත්තේ නැත. ආදරයක් බැඳීමක් බලෙන් හිතට කාවැද්දවිය නොහැකි බවවත් ඇයට අවබෝධයක් නැතුවා මෙනි.

**"මගේ ජීවිතේ ඉස්සර නම් තීරණ ගත්තේ අම්මයි අප්පච්චියි තමා. ඒත් දැන් මං. මං ළඟදිම කොළඹ එනවා තේනුක අයියා. බිස්නස් එකක් පටන් ගන්නවා. අප්පච්චිත් සපෝර්ට් එකක් දෙන්නම් කිව්වා..."**

තේනුකගේ කට කොනකට සිනාවක් නැගුණේය.

**"ඔයා මේ කොළඹ ගැන දන්නෙ නැතුව නංගි. අනික ඔයා මොන බිස්නස් කරන්නද?"**

**"සැලෝන් එකක්... මම රූපලාවණ්‍ය ගැන ඩිග්‍රි එකකුත් කරලා තියෙන්නේ..."**

**"වෙන්න ඇති. මෙහෙ හැමතැනම සැලොන් තියෙනවා. ප්‍රසිද්ධ නළු නිළියො දාපු සැලොනුත් තියෙනවා. ඉතින් සැලොන් එකක් නම් නුවරත් දාන්න බැරියැ."**

**"නළු නිළියො දාල ඇති. ඔය කාගෙත් ඒවටත් වඩා වෙනස් විදිහෙ එකක් මං දාන්නේ. අනේ නුවර නම් වැඩක් නෑ අයියා..."**

ඇය කිසිම ප්‍රශ්නයකින් පරාද නොවන ලෙස තේනුකට උත්තර බැන්දාය. ඒ නිසා තවත් ඒ ගැන වචන නාස්ති කරන්නට ඔහුට සිතුණේ නැත. ඔහු ඇමතුම මදක් නිශ්ශබ්දව ගෙවෙන්නට ඉඩ හැරියේය. සෙනෙහෙලතා මැණිකේ නිවස තුළින් කිසිවෙකුත් සමඟ කතා කරනු ළං ළංව ඇසුණේය. ඔහුගේ ඇස් අම්මාගේ හඬ එන පසට හැරුණේය.

**"සුදු පුතාට මං අයියෙක් පෙන්නන්න යං..."**

සෙනෙහෙලතා මැණිකේගේ ඒ වචනත් සමඟ තේනුකගේ හිත ගැස්සුණේය. ඒ හිත කුතුහලයෙන් පිරුණේය. ගෙතුළ සිටින අනෙක් පුතා කවුදැයි ඔහුට සිතෙද්දී, චතුමිණී අනෙක් පසින් කතා කරනු ඇසුණේය.

**"කොහොමත් මං කොළඹ එන්නෙ කැමැත්තෙන් තේනුක අයියා. එතකොට අපිට හම්බවෙන්නත් පුළුවන්..."**

තේනුකගේ සන්සුන් සිත ආයෙත් ගිනි වැදුණේය. ඇගේ හිත වෙනස් කරන්නට කරන්නේ කුමක්දැයි සිතද්දී සෙනෙහෙලතා මැණිකේ ඇතුළු දෙරින් කෑම කාමරයට ආවාය. ඇයත් සමඟ ඇගේ දැවටෙමින් ආවේ ඌරු පැටවෙකු තරමට මහත ලැබ්‍රඩෝ වර්ගයේ බල්ලෙකි. ඒ දසුන දකිත්ම පහදා දිය නොහැකි ආසාවක්, සතුටක් වැන්නක් තේනුකගේ සිතේ ඉහිර ගියේය.

**"මං දන්නවා එතකොට ඔයාගේ ඔය නපුරුකම යවලා ඔයත් එක්ක යාළුවෙන හැටි..."**

චතුමිණී අනෙක් පසින් කියන දේවල් නෑසෙන ගානට ඔහු සිටියේ ඒ කතාවන් අසා සිටින්නට අකමැත්තෙනි. ඇගේ හිත බිඳ දමන්නට දිය යුතු එකම උත්තරය ඔහුගේ මුවට සිය වරකටත් වඩා ආවේය. ඒත් හිතාමතා සතුරන් ඇති කරගැන්ම හොඳ නැති බව ඔහු දැන සිටියෙන් පෙම්වතියක සිටින බව නොකියා සිටියේය.

**"මට වැඩ තියෙනවා චතුමිණී, මං තියනවා..."**

ඇගෙන් උත්තරයක් එනතුරු නොසිටම ඔහු ඇමතුම විසන්ධි කළේ සෙනෙහෙලතා මැණිකේ සමඟ හුරතල් වන අලුත් සුදු පුතා දෙස බලමිනි.

**"මෙයා කොහෙන්ද...? මං ඒත් බැලුවා ඔයාට තව පුතෙක් කොහෙන්ද කියලා."**

ඉඳ සිටි තැනින් නැගිට අම්මා පසුපසින් විසිත්ත කාමරයට යන ගමන් තේනුක කීවේ ආසාවෙනි. තේනුකගේ දුරකතනය ආයෙත් නාද වුණේය.

> **මං දන්නවා එතකොට ඔයාගේ ඔය නපුරුකම යවලා ඔයත් එක්ක යාළුවෙන හැටි**

දුරකතනයේ තිරය දෙස බැලූ සැනින් ඔහු සිතට කේන්තියක් ආවේය. ආයෙත් චතුමිණීය. ඔහු ඇමතුම විසන්ධි කර දුරකතනය නිවා දැමුවේ ඇය නැවත නැවත ඇමතුම ගන්නා බව දන්නා නිසාය.

සෙනෙහෙලතා මැණිකේ ලොකු සෝෆා පුටුවෙන් ඉඳගනිද්දී, ඒ සැනින් බල්ලාද පුටුවට නැග ගත්තේය. ඒ දුටු තේනුකගේ දෙතොලට නැගුණේ සිනාවකි. සෙනෙහෙලතා මැණිකේ ළඟට ගියා විතරක් නොව රෝස පාට දිවත් එළියට දමාගෙන බල්ලා ඔහුට සිනාසෙන්නාසේය. තේනුක ළඟට ගොස් බල්ලාගේ හිස පිරිමැද්දේය. ඒ සිනිඳු බව හිතටත් දැනුණා සේය.

**"අම්මා... මෙයා කොහෙන්ද?"**

මුල් ප්‍රශ්නයට උත්තරයක් නොලැබුණ නිසා තේනුක ආයෙමත් ඇසුවේය.

**"මං ගෙදර තනියම කියලා, මේනක ගෙනත් දුන්නා. මේ ලොකු වෙලා හිටියට තාම මාස අටයි..."**

සෙනෙහෙලතා මැණිකේ බල්ලාගේ නළලද සිම්බාය.

**"මෙයා සිම්බා... ඒ වුණාට මගෙ සුදු පුතා. එයා ගොඩක් කැමති කුස්සිය පැත්තේ ඕපන් වැරැන්ඩා එකටයි ගාර්ඩින් එකටයි. මමත් ගෙදර වැඩිපුර ඉන්නෙ ඒ පැත්තෙ හින්දා වෙන්න ඇති..."**

සෙනෙහෙලතා මැණිකේ කීවේ සිම්බාගේ හිස මුදුව අතගාන ගමන්ය.

**"මට දැන් තේරෙනවා... අම්මා දැන් වැඩිය මාව බලන්න නේන්නෙ ඇයි කියලා. ඔයාගෙ සුදුපුතා ඉන්න හින්දා නේද..?"**

අමනාපයෙන් සේ තේනුක කීවද ඒ බොරුවටය. ඇත්තටම ඔහුගේ හිතෙත් සිම්බා ගැන ආසාවක් ඇති වුණේය. සමහරවිට මෙවන් බල්ලෙක් හදන්නට අංජනාත් කැමති වනු ඇත. තේනුක අම්මා ළඟින්ම සෝෆාවේ අනෙක් පසින් ඉඳගත්තේය. අනතුරුව හෙමින් හෙමින් සිම්බාගේ ඔලුව අත ගෑවේය.

**"අයියා හොඳ වැඩත් කරනවා ඉඳලා හිටලා..."**

තේනුක කීවේ සෝෆාවෙන් බිමට බැස්ස සිම්බා දෙකකුල් අතරට ළං කර ගනිමිනි.

**"දැන් මොකද අර ළමයට කිව්වේ...?"**

තේනුකගේ උත්තරය කුමක් වේදැයි සැකයෙන් සෙනෙහෙලතා මැණිකේ ඇසුවාය.

**"මට ලංකාව එපා කරවන්න හදන්නෙ එයා. අම්මා දන්නවනෙ, මං මේ ලංකාවෙ ඉන්නෙ ඔයා හින්දා කියලා..."**

සෙනෙහෙලතා මැණිකේගේ හිත ගැස්සුණාය. චතුමිණීගේ හැසිරීම නිසා පුතු ආපසු ජපානයට යාවිදැයි ඇගේ හිත බය වුණාය. ඒත් පුතුටද අනාගතයක් තිබිය යුතුය.

සොහොයුරා ගෙන ආ යෝජනාවට කැමතිවූයේ එනිසාය. ඒත් එය දරුවාට මෙතරම් මානසික පීඩාවක් වෙතැයි ඇය සිතුවේ නැත.

සෙනෙහෙලතා මැණිකේ සැබැවින්ම සිතුවේ තේනුක මේ යෝජනාවට කැමති වෙතැයි කියාය. ඒත් සිදුවූයේ වෙනකකි. මේ වාතාවරණය තුළ ප්‍රශ්නය විසඳන්නට නම් දෙපාර්ශවයෙන් එක් අයෙක් ඉවත ලන්නට සිදුවනු ඇත. ඒත් දෙපාර්ශවයේම ඉන්නේ ලේ ඥාතීන්ය. එක් පසෙකින් පුතුය. අනෙක් පසින් සොහොයුරාය. එතැනින්ද වැඩිපුර වටින්නේ පුතුය.

**"අම්මා, ඇත්තටම මං අද ආවෙත් ඔය ප්‍රශ්නෙ ගැන අම්මත් එක්ක කතා කරන්න..."**

තේනුක කීවේ ඔහුගෙන් ඈත්ව ගොස් ටයිල් පොළොවේ උඩුබැලි අතට පෙරලෙන සිම්බා දෙස බලාගෙනය.

**"පුතාගෙන් මං ප්‍රශ්නයක් අහන්නද...?"**

ඔහු ඒ ප්‍රශ්නය කතා කරන්නට පෙර සෙනෙහෙලතා මැණිකේ ප්‍රශ්නයකට අවසර ඉල්ලුවාය.

**"මොකද්ද අම්මා...?"**

**"පුතාට කවුරුහරි ගෑනු ළමයෙක් ඉන්නවද?"**

ලබන සතියට...

# අහිංසක සත්තුන්ට කන්න ටිකක් දුන්නා කියලා කවදාවත් අපිට අගහිඟ වෙලා නෑ



දිව්‍යා දොස්තර නෝනයි ළමයි ටිකයි සමඟ

**අනේ අසරණයෝ මිනිස්සු එහෙම අත පය, කොඳු කඩලා දැම්මම පාරවල් දිගේ ඇදි ඇදී යන හැටි දකිනකොට මටනම් වාවන්නෙ නෑ**

**"දෙස්තර නෝනව මට හම්බවෙන්නෙ පාරක් අයිනෙන්. ඇටකටුව එළියට එන්නම කැඩුණ කකුලක් එල්ලගෙන හිටපු දෙස්තර නෝනා කවුරුහරි ළඟින් යද්දි පිහිටක් ඉල්ලන්න වගේ කෑගැහුවත් කිසි කෙනෙක් එයා දිහා නැවතිලා බැලුවෙ නෑ. එයා මං දිහාත් අසරණ විදිහට බලලා ඇඬුවා. එයාගෙ කකුල දැක්ක ගමන් මං වඩාගෙන ගෙදර ආවා. අම්මායි මායි එයාව අපේ පශු වෛද්‍යවරයා ළඟට එක්ක ගියාම එතැනින් කිව්වෙ ඒ කකුල සනීප කරන්න පුළුවන් තත්ත්වෙක නෑ, කපන්නම වෙනවා කියලා. මට එකපාරටම මතක් වුණේ ඇවිදින්න කකුලයි, අත් දෙකකුයි ඉතුරු වුණත් පූසෙක්ට ඇඟ කසාගන්නවත් කකුල නැති වුණොත් බැරිවෙනවනෙ කියලා. මං ඩොක්ටර්ට කිව්වා, මං පුළුවන් හොඳට බලාගන්නම්, කකුල කපන්න එපා කියලා. ඇත්තටම මං දෙස්තර බේත් එක්ක මගේ මහන්සියෙන් එයාගෙ කකුල සනීප කරගත්තා. ඒ වෙනුවෙන් ගොඩක් වතාවක් එයාව මං ඩොක්ටර් ගාවට එක්ක ගියා. ඒ හින්දම එයාට වැටුණ නම තමයි දෙස්තර නෝනා."**

ඒ විදිහට නැතිවෙන්නට ගිය දෙස්තර නෝනගෙ කකුල සුවකර දුන්නේ කොළඹින් ඈත නොච්චියාගම දිව්‍යා රත්නායකයි. විසිහතර හැවිරිදි දිව්‍යා මානව සම්පත් කළමනාකරණ උපාධිය අවසන් කර රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින්නියකි. ඇය සතුන්ට පෙම් බඳින්නේ බහ තෝරන වියේ පටන්ය. ඒ ද ලස්සන, හැඩකාර සත්තුන්ට නොවෙයි. කවුරුත් නොබලන, කාගෙවත් හච්හරණක් නැති සත්තුන්ටය. දිව්‍යා පුංචි කාලේ පටන් සත්තුන්ට දක්වන මේ සෙනෙහසට ඇයට හයියට සිටින්නී ඇගේ අම්මාය. එසේම ඒ සතුන්ගේ බඩ පුරවන්නට උදව් දෙන්නේ හමුදා සේවයෙන් විශ්‍රාම ලැබූ තාත්තාය. මල්ලීත් ඒ ලෙසම සත්තුන්ට ආදරය කරන හදවතක් ඇතිව උපන්නෙකි.

**"මං මුලින්ම හදපු පූස් බබා පර්ල්. එයාව මට හම්බවුණේ පාරෙ මැරෙන්න වැටිලා ඉන්නකොට. ඒ බල්ලෙක් අල්ලලා බෙල්ලෙ ලොකු තුවාලයකුත් එක්ක. එදත් අම්මයි මමයි එයාව ගෙදර ගෙනාවා. කොහොම හරි බෙහෙත් කරලා පර්ල් බබාව හොඳකර ගත්තා. ඊටපස්සෙ ඒ වගේ සත්තු දෙන්නෙක් තුන්දෙනෙක් හදනකොට සමහර මිනිස්සු ආබාධිත වුණ, තුවාල හැදිච්ච සත්තු ගෙනත් අපේ ගෙදර ඉස්සරහින් දමලා යන්න පටන් ගත්තා. ඒක සදාචාරයක් නැති වැඩක් වුණත් ඒ වැරැද්ද කරන අයට මං බනින්න ගියෙ නෑ. එහෙම දලා යන අයව ගෙදරට අරන් හදාගත්තා. අවුරුදු ගාණක් තිස්සේ එහෙම හදපු සත්තුන්ගෙන් අදටත් පූස්ලා දෙළොස්දෙනෙක් මං ළඟ ඉන්නවා."**


බෝනි අම්මා, කිටී මහත්තයා, හිච්චි කොටේ, මද්දු බේබි, දෙස්තර නෝනා, ජූලි, කෝලා, නොරිකෝ, සනුකි, සුද්දි, කළු මහත්තයා, කොටා මහත්තයා දිව්‍යාගේ ඒ සුරතලුන් දෙළොස්දෙනාය.

මේ හැම කෙනෙකුම වාගේ තුවාල කරගෙන, ලෙඩ රෝග හදාගෙන හමුවුණ අයයි. එසේම ඒ අතරේ වැඩිපුර සිටින්නේ පූස් ගෑනු ළමයින්ය.


ඇය මේ සතුන් හදන්නේ යහමින් වියදම් කරන්නට මුදල් තිබී නොවේ. ඔවුන්ට ජීවත් වෙන්නට, ඉගෙනගන්නට, අඳින්නට, ජීවිතයේ තවත් බොහෝ දෑ කරන්නට තිබුණේ තාත්තා හමුදා රස්සාවෙන් ඉපැයූ වැටුපය. ඒත් එයින් ටිකක් සත්තු වෙනුවෙන් යොදවන්නටත් ඒ තාත්තා අකමැති වූයේ නැත. ඒ සත්තුන්ගේ කෑමට බීමට විතරක් නොව බේත්හේත්වලටත් එක්කය.



කිටී මහත්තයා



මද්දු බේබි



හිච්චි කොටේ

**මං මුලින්ම හදපු පූස් බබා පර්ල්. එයාව මට හම්බවුණේ පාරෙ මැරෙන්න වැටිලා ඉන්නකොට**

**"අපිට අත පය හතර තිබිලත් ලෙඩ වුණාම කොච්චර අසරණ වෙනවද? කොච්චර බය වෙනවද? මෙච්චර ලොකු ඇඟක් තියෙන අපි එහෙම වෙද්දි මේ පුංචි ළමයි ඒක කොහොම දරාගන්නද? සත්තු වාහනවලට හැප්පුණාම වාහනේ ඉන්නෙ ගොඩක්දෙනා වාහනෙන් බැහැලා ඒ සතාට මොකද කියලා හොයලා බලන්නෙ නෑ. පුළුවන් නම් ඊට වඩා වේගෙන් පාගලා යනවා. නොමැරී බේරෙන එහෙම වුණ සත්තු කෑගගහ අඬනවා ඇරෙන්න කතා කරලා පිහිටක් ඉල්ලන්නද? අනේ අසරණයෝ මිනිස්සු එහෙම අත පය, කොඳු කඩලා දැම්මම පාරවල් දිගේ ඇදි ඇදී යන හැටි දකිනකොට මටනම් වාවන්නෙ නෑ. මගේ ඇහැට පෙනුණ ඒ වගේ සත්තු කවුරුත් ඊටපස්සෙ මහමඟ දුක් වින්දෙ නෑ. එහෙම මං සත්තුන්ට පිහිටවෙන්නෙ සල්លි මුදල් වැඩිපුර වියදම් කරන්න තිබිලා නෙවේ. අපිට වියදම් කරන්න තියෙන්නෙ දැන් තාත්තගෙ පැන්ෂන් එක. එයා ඒකෙන් අපේ වැඩත් කරලා කොහොමහරි මේ දෙළොස්දෙනාගේ බඩවල් පුරවන්න මට සාලයොත් හැමදාම ගෙනත් දෙනවා. සතෙකුට ආදරේ දෙන්න, ජීවිතේ දෙන්න අපිට සල්ලිම ඕනෙ නෑ. ආදරේ කරුණාව හිතේ තියෙනවා නම් එයාලට එක වේලක් හරි බඩ පිරෙන්න කන්න දීලා ඒ ජීවිතත් ලස්සන කරන්න පුළුවන්. අනික එයාලට අපි නොමසුරු සිතින් සලකනකොට ඒ දේවල් අපිට ලැබෙනවා. ඒක නම් අපිට හොඳට දැනිලා තියෙන දෙයක්. අපිටත් අගහිග තියෙනවා. ඒත් කවදාවත් අපිට දේවල් නැතිවෙලා නෑ."**

දිව්‍යා ළඟ වැඩිපුර සිටින්නේ පූස් කෙල්ලන්ය. බොහෝදෙනෙකු ගෙවල්වල පූස් කෙල්ලන් හදන්නට අකමැතිය. ඔය හේතුව නිසාත් පූස් කෙල්ලන්ට ගෙවල් නැතුව මහමගට වැටී ඉබාගාතේ යන්නට සිදුවේ. බොහෝදෙනෙකු පූස් කෙල්ලෙකු ගෙන තරුණ වියට එද්දී වන්ද්‍යාකරණ සැත්කම කරන්නටත් අකමැතිය. ඊට ඔවුන් දෙන ලේසිම උත්තරය 'පව්' කීමය. ඒත් ගෙයක් දොරක් නැතුව ඉබාගාතේ ගොස් අසරණ වෙන එක හෝ පූසියක් පැටවුන් දැමූ කල ඒ පැටවුන් ගෙදරින් එළියට විසි කිරීම පවක් සේ ඔවුන් දකින්නේ නැත. දිව්‍යාත් ඇගේ සෙවණට ගත් පූස් කෙල්ලන් ටික කලකින් වන්ද්‍යාකරණය කරයි. ඒ සතාගේම හොඳටය.

**"එහෙම නොකළොත් වෙන්නෙ එයාලා පැටව් දලා දලා අපේ ගෙදර පූස් හමුදාවක් හැදෙන එක. එතකොට නම් මට එයාලට සලකගන්න බැරි තත්ත්වයක් එයි. මොකද අම්මෙක් පැටව් දැම්මට පස්සෙ මං ආස නෑ අම්මගෙන් පැටව් එක එක්කෙනා වෙන් කරලා දෙන්න.**

**කතා කරන්න බැරිවුණාට එයාලත් දරුවන්ට ආදරෙයි. අපි අම්මා එක්ක ඉන්න ආසයි වගේ, පූස් අම්මත් එක්ක ඉන්න ඒ දරුවොත් ආසයිනේ. ඒ හින්දා පැටව් දැම්මොත් මට දෙන්න ලෝබයි. අන්න ඒ නිසයි මං ගෙදරට ගන්න පූස් කෙල්ලොන්ට වන්ද්‍යාකරණ සැත්කම කරවන්නේ. හැබැයි අපේ දෙස්තර නෝනට මං එක පාරක් අම්මෙක් වෙන්න අවස්ථාව දුන්නා. එයාට දරුවො තුනක් ලැබුණා. එතකොට ඉස්සරහ ගෙදර ඉඳලා අපේ ආදරේට ලෝබවෙලා ඇවිත් මේ ගෙදර පදිංචි වුණ බෝනි අම්මත් එක පාරක් අම්මෙක් වුණා. එයාගෙ දරුවො දෙන්නා හිච්චි කොටෙයි, මද්දු බේබියි. හිච්චි කොටේටත් අම්මෙක් වෙන්න පුළුවන් වුණා මේ ළඟදි. එයාටත් දැන් දරුවො තුන්දෙනෙක් ඉන්නවා. අනේ ඉතින් මේ ගොල්ලන්ගෙ ජීවිත ලස්සන කරලා, එයාලා එක්ක කාලෙ ගෙවනකොට අපේ ජීවිතත් ලස්සන වෙනවා."**

සතෙක් වුවද පිළිවෙලකට හදද්දී ඒ පිළිවෙළ හුරුවෙයි. කෑමට, බීමට නිදන්නට සේම ශරීර කෘත්‍යත් ලස්සනට පිළිවෙලට කරන්නට දිව්‍යා ඇගේ පූස් දරුවන්ට කියා දී ඇත. කෑම වෙලාවට පිඟන් ටික තබා **"පුංචි ළමායි..."** කී සැනින් කෑමට දිවවිත් පිඟන් ළඟින් ඉඳගන්නේ ඒ හැදියාව නිසාය. දිව්‍යා කියන්නේ, ඔබේ ගෙදර පූසෙක් නැති ගෙදරක් නම් ගොඩක් නෙවේ, එක පූසෙක් හරි හදලා බලන්න, හිතට දැනෙන සතුට කොයිතරම්ද කියා දැනෙනු ඇති බවයි.

බියංකා නානායක්කාර

## පාඩම් අංක 15

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් අද අපි ස්වයං රැකියාවක් විදියට මෝරු මිරිස් හදාගමු.**

**ස්වයං රැකියා**

**මේවා මාස හයක් විතර කල්තියාගන්න පුළුවන්. මෝරු මිරිස් කරල් දහයක් දොළහක් දාගත්තු පැකට් එකක් රුපියල් 100-120 වගේ මිලකට අලෙවි කරන්නත් පුළුවන්**

# අමුමිරිස් ලාබ කාලෙට ලාබ ලැබෙන වැඩක් කරමුද?




බත් කනකොට කටගැස්මට මිරිස් කරලක් හපන එක සමහර අයට පුරුද්දක් වෙලා. අමුමිරිස්, නයි මිරිස්, බැදපු මිරිස්, කොච්චි මිරිස් අතරේ ගොඩක් අය හොය හොයා කන තවත් මිරිස් ජාතියක් තමයි මෝරු මිරිස්. නම කිව්ව හැටියේ මතක් නොවෙන්නත් පුළුවන්. වෙළඳපොළේ කහ පාටට හුරු වියළාගත්තු මිරිස් වර්ගයක් තියෙනවා දැකලා තියෙනවා නේද? අන්න ඒවට තමයි මෝරු මිරිස් කියලා කියන්නේ.

පොල් සම්බලක්, කරවල බැදුමක් එක්ක එහෙම නියමෙටම ගැළපෙන නිසා ගොඩක් අය මේවා දැක්ක ගමන් දෙපාරක් නොහිතා මිලදී ගන්නවා.

ඔය අනිත් මිරිස් වගේ මේවා පොඩ්ඩක්වත් සැර නැහැ. ඒ නිසා දැවිල්ල නැතුව දැවිල්ල කන්න කැමති අය මෙව්වට බොහොම ප්‍රියමනාපයි.

මෝරු මිරිස් කියන්නේ ඉන්දියාවෙන් අපිට ලැබුණු කෑමක්. එයාලා මේවට කියන්නේ 'මොරු මුලහයි' කියලා. ඉන්දියාවේ වර්ෂාපතනය අඩු ප්‍රදේශවල අය ස්වයං රැකියාවක් විදියට මේ මෝරු මිරිස් අලෙවි කරලා හොඳ මුදලක් හම්බ කරනවලු. ඉතින් නිකන් ඉන්න එකේ ඔයාලටත් මේ මෝරු මිරිස් ටිකක් හැදුවොත් විකුණාගන්න බැරිකමක් නෑ. අනික ගෙදරදොරේ කාර්යබහුලත්වය එක්ක මහන්සි නොවී කරන්න පුළුවන් ස්වයං රැකියාවක් හොයන කෙනෙක්ට වුණත් මේ වැඩේ කදිමෙටම ගැළපෙනවා. හරි, මෝරු මිරිස් හදාගන්න හැටි දැන් අපි බලමු.

මෝරු මිරිස් හදාගන්න අවශ්‍ය වෙන්නේ අමුමිරිස් 500g, මුදවපු කිරි 100g, රස අනුව ලුණු, කහ 5g කියන මේ දේවල් ටික විතරයි.

මෝරු මිරිස් හදනවා නම් හැබැයි මේ කාරණා ටිකත් මතක තියාගන්න ඕනේ. සාමාන්‍යයෙන් සමහර කාලවලදී අමුමිරිස්වල මිල ගණන් ඉහළ යනවනේ. අන්න ඒ කාලෙට මේ බිස්නස් එක කරන එක පාඩුයි. ඒ නිසා අමුමිරිස් ලාබ කාලේ බලලා තමයි වැඩේ පටන්ගන්න ඕනේ. ඒ වගේම මේකට හොඳට අව්ව තියෙන්නත් ඕනේ.

මී කිරියි, අමුමිරිසුයි ගන්නකොට හොඳම ප්‍රමිතියෙන් යුතු ඒවා ගන්න ඕනේ. එතකොට තමයි නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩිවෙන්නේ.




### පියවර 1

**හරි මුලින්ම අමුමිරිස් ටික හොඳට සෝදලා තෙතමාත්තු කරලා මිරිස් කරල මැදින් යන්තම් පැල්මක් දාන්න. හැබැයි සම්පූර්ණයෙන්ම මිරිස් කරල පලන්න එහෙම යන්න එපා.**

### පියවර 2

**අර සපයාගත්තු මුදවපු කිරි ටිකයි, කහයි, ලුණුයි ක්‍රීම් එකක් වෙනතුරු හොඳට බ්ලෙන්ඩ් කරන්න. මිශ්‍රණයේ ලුණු රස ටිකක් වැඩි වුණාට කමක් නෑ. හැබැයි ඕනවට වඩා නෙමෙයි, කන්න පුළුවන් තරමට.**

### පියවර 3

**හදාගත්තු මිශ්‍රණය මැටි මුට්ටියක හරි වීදුරු භාජනයකට හරි දාගන්න. ඒ කරලා ඒකට අර කපාගත්තු අමුමිරිස් කරල් ටික දාගන්න. මිශ්‍රණය මිරිස්වල හොඳට තවරන්න. හැබැයි එකක් මතක තියාගන්න. කොයි වෙලාවකවත් මේවා අතින් අල්ලන්න එපා. පස්සේ හුළං යන්නේ නැති විදියට මේ භාජනය වහලා දවස් තුනක් විතර තියන්න. ඒ වගේම ඒ හැම දවසකම මිරිස් ටික එහෙට මෙහෙට යන විදියට භාජනය සොලවන්නත් ඕනේ.**






### පියවර 4

**තුන්වෙනි දවසේ මිරිස් ටික තැටියක අතුරලා අව්වෙන් තියන්න. මිරිස් ටික වේලෙනකල් දවස් 3-4ක් හොඳට අව්වේ වේලගන්න. ඊටපස්සේ කරල් ටික හුළං නොවදින විදියට පැකට් කරගන්න.**






මේවා මාස හයක් විතර කල්තියාගන්න පුළුවන්. මෝරු මිරිස් කරල් දහයක් දෙළහක් දාගත්තු පැකට් එකක් රුපියල් 100-120 වගේ මිලකට අලෙවි කරන්නත් පුළුවන්. ඉතින් කිසිම දෙයක් නොකරම ගෙදර ඉන්න කෙනෙක් නම් ලේසියෙන්ම හදාගන්න පුළුවන් මේ මෝරු මිරිස් ටිකක් හදලා බලන්න. මේ ගැන තව විස්තර මොනවාහරි දැනගන්න ඕනේ නම් 0714766819 කියන අංකයට කතා කරන්නත් පුළුවන්.



**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# මැගී අත සහිත උස් කර මෝස්තරය සැදීම

පාඩම් අංක 29

## මැගී අත සහිත උස්කර මෝස්තරය සැදීමට අවශ්‍ය මිමි

1. ඉදිරිපස කර ගැඹුර ---------
2. Cup Point එක දක්වා උස -----
3. උස ----------
4. කර පළල --------
5. උරහිස භාගය -
6. අත් කට ---------
7. පපුව -----------
8. Cup දෙක අතර පරතරය ---------
9. ඉන -------------
10. Bra cut උස ----

| | | G | L |
|---|---|---|---|
| පිටුපස කර ගැඹුර | | 3/4 | 1 |
| කර පළලට එකතු කරන ප්‍රමාණය | | 1 | 1 |
| උරහිස බැස්ම | | 1 1/2 | 2 |
| අත් කටේ වාටියේ උස | | 1/2 | 1/2 |
| ඩාට්වල ප්‍රමාණය | මැද | 3/4 | 3/4 |
| | පැත්තේ | 1 | 1 |

(වගුව 01)

| | පපුව වට | ඉන ඔපනැල්ලේ ප්‍රමාණය |
|---|---|---|
| ඉන ඔපනැල්ලේ ප්‍රමාණය | 28" දක්වා | 1 |
| | 28-36 | 1 1/2 |
| | 36-40 | 2 |
| | 40ට වැඩි | 2 1/2 |

(වගුව 02)


## මැගී අතේ උස්කර මෝස්තරය සැදීමේදී වැදගත් වන කරුණු

1. අත්කට මිනුම සඳහා උරහිස භාගය එන ස්ථානය හරහා සාමාන්‍ය මෝස්තරයක් ලෙස ඇගේ ගාණට අරගන්න.


2. උරහිස භාගය මිනුම සඳහා පපුව මිනුම 4ට බෙදූ පසු එම මිනුමට අඟල් 1ක් පමණ එකතු කරන්න.

## අවශ්‍ය මූලික මිනුම්

(වගුව 01 සහ 02 බලන්න)



1 රූපය



2 රූපය

**පිටුපස පලුව සැදීමේදී ලබාගත් මිමි වගුව අනුව සුළු කර ඉහත රූපසටහනේ පරිදි නිර්මාණය කරගන්න**

**අත්කට මිනුම සඳහා උරහිස භාගය එන ස්ථානය හරහා සාමාන්‍ය මෝස්තරයක් ලෙස ඇගේ ගාණට අරගන්න**



3. මැගී අත සෑදීමේදී මුලින්ම කර පළල ලකුණු කර පසුව උරහිස භාගය ලකුණු කර මේ දෙක යා කිරීමෙන් අත දිගට අවශ්‍ය ප්‍රමාණය ලබාගත හැක.

4. කර පළල සළකුණු කළ ස්ථානයේ සිට ඉදිරිපස උස, ඉදිරිපස කර හෑරීම සහ උරහිසේ සිට Cup එක දක්වා දුර මැනගන්න.

5. මෙම මිනුම් සඳහා සාමාන්‍ය උස්කර මෝස්තරයක් ලෙස අරගන්න.

පිටුපස පලුව සෑදීමේදී ලබාගත් මිමි වගුව අනුව සුළු කර ඉහත රූපසටහනේ පරිදි නිර්මාණය කරගන්න.

මෙම පිටුපස පලුව භාවිතාකර ඉදිරිපස නිර්මාණය කිරීමේදී අවශ්‍ය නම් Bra cut මෝස්තරයට වුවද උස්කර මෝස්තරයේ ඉදිරිපස පලුව සකස් කරගත හැක.

ඉදිරිපස පලුව සෑදීමේදී නිවැරදිව සකස් කරගත් පිටුපස පලුව භාවිතා කර ඉදිරිපස පලුව කපාගන්න.

උස්කර මෝස්තරයේ සාමාන්‍ය ලෙස ඉදිරිපස පලුව සකස්කර ගැනීමේදී පිටපත් කරගත් ඉනේ සිට ඉදිරිපස ඉන සඳහා අඟල් 1ක් පහත් කර ඒ හරහා ඉන රේඛාව ඇඳ නැවත ඉන 1/4 පංගුව ලකුණු කර පසුව යට Dart එක සඳහා අවශ්‍ය ප්‍රමාණය පැත්තට අරගන්න.

මැහුම් වාසිය තබාගැනීමේදී යටට අඟල් 1 1/2ක්ද, පැත්තට අඟලක්ද, උරහිසට සහ කරට මැහුම් වාසිය 1/2ක්ද තබා කපාගන්න.



ප්‍රවීණ ඇඳුම් මෝස්තර නිර්මාණ පුහුණු දේශක සහ බතික් කලාව පිළිබඳව පුහුණු දේශක
චමින්ද කුමාර
You tube - Smart Fashion Lanka

බජාජ් / TVS යමහා ස්කූටර්
ඇතුළු යතුරුපැදි ලීසිං ඇති/ නැති මිලදී ගනු ලැබේ.
0772 357 347

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 24 - 170,000/-
කැරට් 22 - 150,000/-
කැරට් 21 - 120,000/-
කැරට් 20, 18,14, 09. රජයේ ලියාපදිංචි ආයතනයකි.
074 281 93 70
SL PROMO

Salon Coranation
LADIES
NEGOMBO
කොණ්ඩ කැපීම ඇතුළු සියලුම රූපලාවන්‍ය කටයුතු කල හැකි දක්ෂ පලපුරුදු කාන්තාවන් අවශ්‍යයි.
ඉහළ වැටුප්
071 - 810 2414

උපකාරක පන්ති
පළමු ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා සියලුම විෂයයන් 6 ශ්‍රේණියේ සිට ඉහළට දෙමළ විෂය හා 3 ශ්‍රේණියේ සිට ඉහළට ඉංග්‍රීසි විෂය පහත ස්ථානයේ පැවැත්වේ. මෙහෙයවීම ප්‍රධාන විශ්ව විද්‍යාලයේ උපාධිධාරිණියක් හා වසර පහළොවක ප්‍රාථමික පුහුණු ගුරුවරියක් විසින් මෙහෙයවයි. ස්ථානය ගාලු පාර, (මුහුණලා) වාද්දුව
විමසන්න: 0772 610 268

## මගේ නොවන මගේ සෙනෙහසට...

දරාගන්නට බැරිතරමටම
සෙනෙහෙ හද තුළ පිරෙනවා
නිහඬ සෙනෙහස් සුවඳ ඇවිදින්
බොහෝ දේ මට කියනවා

ඔබේ හද තුළ කිරුළු නොපලන්
රැජිණ මම දැයි හිතෙනවා
හිතට නොදැනිම නෙතත් නොදැනිම
දෑස්යුග මගෙ තෙමෙනවා

● **ශ්‍යාමලී අමරතුංග**
**කිරිඳිවැල**

## ශාපය

රකුසු වෙස් ගෙන මිනිස් ඇති රට
මිහිතලය මත සැදූ නරලොව
බියක් සැකයක් නොමැති සිත් තුළ
වරද හිසමත තබා ගනු ඇත

වරද කාගෙද නඩුව කාටද
බලන විට මට පෙනේ වරදම
දෙසක් නැගුමට කවුරු හිඳිනුද
නීතියේ ඇස් වසාගෙන ඇත

අතමිටේ සරු මුදල් තිබුණට
නොදෙන බත්පිඩ නුඹගෙ මවටම
කෙලෙස නිවුණිද නුඹේ කුසගිනි
නිරයේ නීතිය දෙසට යයි නුඹ

නීති ඇත්තේ පොතෙහි පමණද
ක්‍රියා කෙරුමට කිසිත් නැති බව
හැඟෙනවිට මට දැනෙන තරහට
සාප ඇත්තේ මටම විතරද

ආගමක් හොඳ තිබුණමුත් නුඹ
වරද පසුපස වැරෙන් දුවයන
අඟුල්මල් වනු එපා කිසිදින
බුදුන් වැඩි රට රකිනු පණ ලෙස
මිනිස් ගුණ ඇති පිරිස් ලෙසකට

● **ඩී.ශෂිකලා සෙව්වන්දි**
**අම්බලන්ගොඩ**

## සුරු විරු කුමරු

අමුතු අහසක් අමුතු පොළොවක්
මගේ දෑස් ඉදිරිපිට
සොඳුරුයි ඒ අහස මනරම් මේ පොළාව
මිනිසුන්ද සොඳුරු වූ විට
සොඳුරුයි උදෑසන කිචි බිචි
ගී හඬ ඇසෙනවිට
සිත පිබිදෙයි ගත නැහැවෙයි
සිසිල් සුළඟ ගත දැවටෙන විට
අළුයම ඔබ එන්නේ මා පුබුදන්නට
සෙනෙහස බෙදෙමින් මුළු ලොවටම
ඒ වෙන කවුරුත් නොව ආලෝකයෙහි
රජ වන සුර විරු කුමරු හිරු ඔබ
ඔබ දුටු විට නැති වී යයි අලසකම
දුරු වෙයි සන අඳුරද

● **නිම්නා තත්සරණී**
**නයිනමඩම**

## ඈ

විඩාබර සිත් නිවා සනහන
සිහිල් තව එක දිය පොදක්
රුදුරු කතරට අවාරේ වැහි
සොඳුරු පිණි කැට තැවරුමක්
රිදෙන දෙසවනේ රිදුම් සඟවන
මියුරු මී මැසී පද වැලක්
සුදු පාට තනි කැන්වසය මැද
ඈ මැව්වේ දේදුනු හීනයක්

උසට ඉස්සුනු ළමැද හරියට
නිම්න කඳු ගැට පේළියක්
රවුම් මෘදු වුණු උරස්තල ඇගේ
හෙව්වේ නිදියන යහනතක්
කුසට හිරවුණු පුළුලුකුල නම්
හැඩට කැරකුණු ලතාවක්
සියුම් සුයුමැලි සොඳුරු හැඩ ඇති
ඈ ඉතින් රස ගුලාවක්

රුහුරු දියවුණු නහර වැල්වල
දිව්වේ මුසුවුණු ප්‍රාණයක්
ඉරාගෙන මස් සින්නක්කර ලේ
දුන්නේ තව එක ජීවයක්
නුහුලනා දුක් සුසුම් උහුලපු
හයිය උස මහ මේරුවක්
හැඟුම් සුසුමන් මුහුවෙලා ගිය
ඈ තනිකරම එක කලාවක්

● **ප්‍රමෝද්‍යා ජයවික්‍රම**
**දැරණියගල**

## සපත්තු මහන්නාගේ රබර් සෙරෙප්පුව

කැඩුණු විගසම මිරිවැඩි
සොයා යනවා ජයසිරි
ඇතත් වැඩපළ කඩිමුඩි
තනාදෙනවා නොපැකිළි

සුපුරුදු පරිදි මගදිත්
කැඩුණි මිරිවැඩි මෙදිනත්
යන එන මගක් නැතිමුත්
සොයා ආවෙමි නැවතත්

මිස් ඔබෙ ගමන යන්නට
පයේලා ගෙන හනිකට
කැමතිනම් මෙය ගන්නට
මසා දෙනතුරු හනිකට

සල්ලිය බාගෙ ඇතුවත්
ලෝබකම් කරන බොහොමත්
දුදනන් අතර තවමත්
ඔබ වන් දනන් පොහොසත්

● **සාගරිකා දිසානායක**

## වැස්ස

කොළ හැළෙන උඳුවප් මහේ
සමුගන්නද ඉතිං
දලු දමන සීතල දුරුත්තේ
සමුගන්නද මා
මල් පොපියන වසන්තයේ
සමුගන්නද මා
සිතමින් සිටින මොහොතක
ඇයි? ඔබ
නොසිතාම මා ඇතට
පා කර හරින්නේ
ගස් වැල් කොළ හලන්නට
දලුලන්නට, මල් පිපෙන්නට
බලා සිටී දෑස් දල්වා
නොකියාම ගිය
මා එනතුරා

● **වසන්තා හේරත්**
**ගලගෙදර**

# කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත
ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක



## අහිමි පෙම

| | |
|---|---|
| නුවර වැව දෙසින් මඳ සුළඟ හෙමිහිට | හමයි |
| දළදාවෙ තේවාව බැති සිතට හද | පිනයි |
| ඈත අහසේ බැබළි පුරා සඳ එළිය | දෙයි |
| තනි වු තරුවක් අහසෙ නිවි නිවී එළිය | දෙයි |
| අතීතයෙ සොඳුරු මතක වැව් ඉවුරේ | හැපෙයි |
| දළදාවෙ තේවාව හඬ නිමා වූවා | වගෙයි |
| අඳුරු පැහැ වලාවන් සඳ වසාගන | වගෙයි |
| තනි වු තරුවක් සෙමෙන් කඩා වැටුණා | වගෙයි |
| තුරුලුවුණි ළයට ඔබෙ ආදරය මුසු | කරන් |
| සතුටුවුණි අසා ඔබෙ හැඟුම්බර පෙම් | වදන් |
| රැක ගත්ත මලක් මෙන් පෙම් සුවඳ හද | දරන් |
| වැටුණි තිත පෙමට අප මුළු ලෝකෙට | හොරෙන් |

● **පුෂ්පා පීරිස්**
**මාතලේ**

## පතිනියක වූ දා

| | |
|---|---|
| මිතුරු කැල ගම් පියසෙ සිනා හඬ | නගන්නිය |
| මියුරු ගී තුළින් රස මුසු සුවඳ | හමන්නිය |
| පියරු තැවරු මුහුණෙ කඳුළු බිඳු | මැවෙන්නිය |
| පවුරු බැඳ සෙනෙහසින් මා පියන් | තැවෙන්නිය |
| බොඳ වෙලා නෙතු අගින් කඳුළු බිඳු | හලන්නිය |
| තනිවෙලා මා පියන් වෙතින් සමු | යදින්නිය |
| සැනසිලා ගෙවු සමය අදින් නිම | කරන්නිය |
| අත වෙලා තව අතක පතිනියව | සිටින්නිය |
| නෙතක් නෙතකට ගැටී රස සිනහ | මවන්නිය |
| සිතක් සිතකට බැඳී මඳ සිනහ | නගන්නිය |
| මෙතෙක් ගෙවූ බොළඳ විය අදින් | නිමකරන්නිය |
| මුවැත්තිය විලස ඔහු සමග පිය | නගන්නිය |

● **කලයාණී විජේසේකර**
**අක්මීමන**

## රිදුම් පිරිමැදුම්

හොඳටෝම දුක හිතුණ දවසක
නොකියාම ඔබ ගිහින් තිබුණා
උන්නාට මග බලාගෙන තව
එන්නේම නැති අරුම දැනුණා

ආදරය නොහැඟෙනා හදකට
ම පෙම සියුමැලි වැඩියි හැඟුනා
සාගරය පරදනා කඳුළැලි
මතක සිත්තම් මතට හැලුනා

අයාලේ යන බඹර විසතුඩු
පමා වී හෝ අපුල දැනුණා
කමා දී වරදක කැළැල් මත
අනේ! සමනල පහසෙ රැඳුනා

● **චතුමි දිසානායක**
**රත්නපුර**

## ජීවිතයේ ගමන් මග

පියකරුය ජීවිතය
හදවතින් සිතත්නම්
හැපෙන ගල්පර මැදින්
ගලන ගඟුලක් සේම

අරුත්බරය ජීවිතය
බුද්ධියෙන් සිතන්නම්
ජයකොඩිය නියතයැයි
උත්සාහ වන්තනම්

සුන්දරය ජීවිතය
සෙනෙහසින් සිතන්නම්
රෝස පියුමක් සේම
පතොක් මලක් සේම

පතොක් මලක් සුන්දරයි
නැවතුමකි ජීවිතය
හදවතින් සිතන්නම්
නිමක් නොවනා මග
සංසාර ගමන් මග

● **මල්ලිකා එදිරිසිංහ**
**මහ ඌරගහ**

## වසන්තය

මවු සෙනෙහෙ අහිමි වී අඳුරින්
වැසුණු ඇයගේ බිලිඳුවිය
ජීවිතයේ අපමණ දුක්දැරූ
ඇගේ ළමා විය

නොයෙක් බාධක මැදින්
අතර මැද නැවතිනි
ඉගෙනීමට ආසා කළ
ඇගේ පාසල් විය

වසන්තය නොපැමිණිය ඇගේ
මල්බර යොවුන් විය
රුදුරුවූ බාධක මැදින්
ගමන් කළ ඇගේ මැදිවිය

ගිලන් වී ගිම්මානයේ වැතිරුණු
අසරණ ඇයගේ සැඳෑවිය
ආපසු හැරී බලන්න ඇයිද
නාවේ ඇයගේ ජීවිතයට
මිහිරි වූ වසන්තය

● **එම්.පී.ජේ. ප්‍රනාන්දු**
**කටුනේරිය**




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.